# වාර්ෂික වාර්තාව - 2018

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

පොල්ගොල්ල

# පටුන


| | පිටු අංකය |
|---|---|
| සභාපතිතුමාගේ පණිවිඩය | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | 04 |
| **1. හැඳින්වීම** | 05 |
| 1.1. දැක්ම | 06 |
| 1.2. මෙහෙවර | |
| 1.3. පස්විධ වටිනාකම් | |
| 1.4. අභිමතාර්ථ | 06 - 07 |
| 1.5. ශක්තීන් හා දුර්වලතා | |
| 1.6. කාර්යභාරය | 08 |
| 1.7. සම්පත් | |
| 1.7.1.මානව සම්පත | |
| 1.7.1.1. කළමනාකරණ මණ්ඩලය | 09 - 11 |
| 1.7.1.2. අධ්‍යයන මණ්ඩලය | 12 - 13 |
| 1.7.1.3. විගණන හා කළමණාකරණ කමිටුව. | 14 |
| 1.7.1.4. ආයතනයේ කාර්ය මණ්ඩලය | 14 - 17 |
| 1.7.2.ආයතනික භෞතික සම්පත් | 17 |
| 1.7.2.1. කාර්යාල පරිශ්‍රය | |
| 1.7.2.2. දේශන ශාලා | 17 - 19 |
| 1.7.2.3. සම්මන්ත්‍රණ ශාලා | 19 - 22 |
| 1.7.2.4. නේවාසික පහසුකම් | 22 - 24 |
| 1.7.2.5. වෙනත් භෞතික හා ප්‍රාග්ධන සම්පත් | 24 - 26 |
| **2. ආයතනික ප්‍රගතිය** | 27 |
| 2.1. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු | |
| 2.1.1. 2014 - 2018 වාර්ෂික ආදායම | |
| 2.1.2. 2014- 2018 වාර්ෂික වියදම | |
| 2.1.3. 2014- 2018 කාලය තුල භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | 28 |
| 2.1.4. 2014- 2018 වර්ෂය තුල ආයතනික ඉපයීම්, වියදම් හා ප්‍රතිපාදන | |
| 2.1.5. 2014- 2018 වර්ෂය තුල ලද භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් හා යෙදවීම | |
| 2.2. අධ්‍යයන කටයුතු පිළිබඳ ප්‍රගතිය | 29 |
| 2.2.1. ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය | 29 - 30 |
| 2.2.2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි පුහුණුව | 30 - 31 |
| 2.2.2.1. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව | 31 |
| 2.2.2.2. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව | 32 |
| 2.2.3. ඩිප්ලෝමා පාඨමාලා | |
| 2.2.3.1. සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | 33 - 34 |
| 2.2.3.2. තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව | 34 |
| 2.2.3.3. සමුපකාරික නොවන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | 34 - 35 |
| 2.2.4. සහතික පත්‍ර පාඨමාලා | 35 |
| 2.2.4.1. සමුපකාරික වෘත්තීමය සහතික පත්‍ර පාඨමාලව | |

| | |
|---|---|
| 2.2.4.2. තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලා | 35 - 36 |
| 2.2.5. භාෂා සහතිකපත්‍ර පාඨමාලා | 36 |
| 2.2.6. විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් | 36 – 37 |
| 2.2.7. පුහුණු මාර්ගෝපදේශය අනුව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් | 37 - 38 |
| 2.2.8. පුහුණු මාර්ගෝපදේශයෙන් බැහැරව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් | 38 - 39 |
| 2.2.9. අන්තර් ජාතික පුහුණු වැඩසටහන් | 39 |
| 2.2.10. වෘත්තීය පාඨමාලා සඳහා සිසුන් සූදානම් කිරීම | 40 |
| 2.2.11. ආයතනික සම්පත් උපයෝගී කරගෙන බාහිර ආයතන පැවැත්වූ පුහුණු වැඩසටහන් | 40 - 41 |
| 2.3. ආයතනයේ අධ්‍යයන පහසුකාරක සේවා ප්‍රගතිය | 41 |
| 2.3.1. නේවාසික අංශය | |
| 2.3.2. පුස්තකාල අංශය | 42 |
| 2.3.3. විභාග අංශය | 42 - 44 |
| 2.3.4. මුද්‍රණාල අංශය | 44 |
| 2.3.5. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය | |
| 2.3.6. ශ්‍රවනාගාරය | 44 - 45 |
| 2.4. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය | 45 - 46 |
| **3. අභියෝග හා අපේක්ෂාවන්** | 47 - 48 |
| **4. මූල්‍ය වාර්තා** | 49 - 66 |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව | |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්ථාව | |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය | |
| 2018.12.31 දිනට ගිණුම් සම්බන්ධ සටහන් | |
| **5. විගණකාධිපති වාර්තාව -2018** | 67 - 74 |

## සභාපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත් සංවර්ධනය කිරීමෙහිලා පුරෝගාමී රාජ්‍ය මට්ටමේ ජාතික ආයතනයක් වශයෙන්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 වාර්ෂික වාර්තාව සඳහා එහි සභාපතිවරයා ලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව සතුටු වෙමි.

2018 වර්ෂයේ දී ආයතනයේ භෞතික, මානව හා මූල්‍ය සම්පත් එහි අපේක්ෂිත අරමුණු සාධනය කර ගැනීම උදෙසා කාර්යක්ෂමව හා සඵලදායි ලෙස උපයෝජනය කර ඇති ආකාරයත්, එහි ප්‍රගතිය හා ගිණුම් කටයුතු භාවය පිළිබඳවත් මනා අවබෝධයක් මෙම වාර්තාව මඟින් ලබා ගත හැක.

විශේෂයෙන්ම සීමිත ආයතනික සම්පත් හා මානව සම්පත මනා ලෙස කළමණාකරණය කරමින් ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යවසායන්හි තිරසාර සංවර්ධනයක් සඳහා එහි වැදගත්ම සම්පත වන මානව සම්පත දැනුම, කුසලතා, ආකල්ප හා ඊට අදාල පරිචයන්ගෙන් පෝෂිත කිරීම සඳහා 2018 වර්ෂයේදී ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ගෙන ඇති ප්‍රශංසනීය මෙහෙවර ආයතනයේ වත්මන් සභාපතිවරයා ලෙස අගය කරමි.

**"තිරසාර පැවැත්මක් සහිත නිර්මාණශීලී හා නව්‍යකරණයෙන් යුතු ගෝලීය සම්බන්ධතාවයන්ගෙන් සමන්විත සමුපකාර ජන සමාජයක් ස්ථාපිත කිරීමට "** අවැසි ආයතනික නිෂ්ටාව සාක්ෂාත් කරගැනීමට සමුපකාර ක්ෂේත්‍රයේ අධ්‍යයන පුහුණුව හා පර්යේෂණ කටයුතු ඉටු කරන ප්‍රමුඛතම ජාතික ආයතනයක් ලෙස ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ මහගෙදර නමින් විරුදාවලියලත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට හා එහි සමස්ථ කාර්ය මණ්ඩලයට අවශ්‍ය ශක්තිය ධෛර්ය නිරතුරුව ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

රෝහණ කීර්ති දිසානායක  
සභාපති  
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය  
පොල්ගොල්ල.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය



ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 වාර්ෂික වාර්තාව එළිදැක්වෙන මෙම අවස්ථාවේ සමුපකාර ව්‍යාපාරයේත් අප ආයතනයේත් අභිවෘද්ධිය හා තිරසාර පැවැත්ම ප්‍රාර්ථනා කරමින් මෙම සටහන තබමි.

විශේෂයෙන්ම 2018 වසර තුළ පෙර වසර වලට සාපේක්ෂව ආයතනික මානව සම්පත් පිළිබඳ ගැටළු, විවිධ දුෂ්කරතා හා අභියෝග පැමිණියද 2018 වර්ෂයේ සැළසුම්ගත ඉලක්ක උපරිම මට්ටමින් ලඟාකර ගැනීමෙහිලා කළමණාකරණ මණ්ඩලය, අධ්‍යයන මණ්ඩලය ප්‍රමුඛ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඉටු කර ඇති මෙහෙවර අගය කරමි.

ගෝලීය වෙනස්කම් හමුවේ සමුපකාර ව්‍යාපාරය මුහුණ දෙන අභියෝග ජයගත හැකි පරිදි කටයුතු කිරීමට යෝග්‍ය මානව සම්පතක් බිහි කිරීමේ අවශ්‍ය මෙහෙවර ඉටු කිරීමටත් ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය වෙත දැනුම සපයන්නා ලෙස විශිෂ්ඨත්වයට පත්වීමටත් ආයතනය වෙත ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ජී. එච්. එම්. ඒ. ප්‍රේමසිංහ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල.

# 1. හැඳින්වීම

ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ලෙස ප්‍රතිසංවිධානය කරන ලද්දේ එතෙක් පැවති සමුපකාර අධ්‍යාපන සම්ප්‍රදායෙන් මිදී ගෝලීයකරණ පරිසර සාධකයන්ට සාර්ථකව මුහුණ දියහැකි නව උපායමාර්ග හා ක්‍රමවේදයන් සපිරි අධ්‍යාපනයක් සමුපකාර ව්‍යපාරයට ප්‍රදානය කිරීමේ අභිලාෂයෙනි. ඒ අනුව එතෙක් පැවති පොල්ගොල්ල සමුපකාර විද්‍යාලය 2001 අංක 01 දරණ පාර්ලිමේන්තු පනත මගින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් සංස්ථාගත ආයතනයක් ලෙසට 2001 ජූලි මස 01 දින සංස්ථාපිත කරන ලදි.

එතෙක් සමුපකාර දෙපාර්තමේන්තුව මගින් පාලනය වූ සමුපකාර විද්‍යාලය ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙසට පරිවර්ථනය වෙමින් ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම කළමනාකරනය කිරීම සහ පාලනය කිරීම යන කාර්යයන් මේ පනතින් නව ආයතනය වෙත පවරා දී ඇති හෝ භාර කොට ඇති බලතල අනුව කළමනාකරණ මණ්ඩලයකට පැවරෙන්නේය.

එම කළමනාකරණ මණ්ඩලය රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශ කිහිපයක නියෝජිතයින්ගෙන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල විද්වත් පුද්ගලයින්ගෙන් සමන්විත වන්නේය.

සමුපකාර ක්ෂේත්‍රය ප්‍රමුඛ කරගනිමින් වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරිම තුලින් නිපුණතා සංවර්ධනය වැඩිදියුණු කිරිමටත්, ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපන හා පුහුණු ක්‍රමවේදයන්ට අනුගතවීමත් සැළකිල්ලට ගනිමින් නව ආයතනය ක්‍රියාත්මක වේ. මෙම අපේක්ෂාවන් ඉටුකරගැනීම සඳහා හිතකර වූ අධ්‍යාපනික පරිසරයක් හා ඉඩ පහසුකම් මෙම ආයතනය සතුව පැවතීම එම කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට ප්‍රබල සාධකයක් වී ඇත.

සමුපකාරික අගයක් මත පදනම් වූ විවිධාංගිකරණයට යොමු වූ සමුපකාර ව්‍යාපාරය වෙනස්වන පරිසරයට අනුගත වෙමින් ගමන් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතාවය ලබාදීමේ පරමාර්ථයෙන් සමාලෝචිත වර්ෂය තුළ ඩිප්ලෝමා, සහතිකපත්‍ර හා විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරීත්වය, අත්පත් කරගත් ප්‍රගතිය හා ආයතනික වර්තමාන අභියෝගයන් ද සංෂිප්ත ලෙස ඇතුලත් කෙරෙමින් 2018 වාර්ෂික වාර්තාව සකස්කර ඇත.

සමුපකාරික අධ්‍යාපනය ප්‍රමුඛ වගකීම වශයෙන් ආයතනික පනත මගින් පවරා ඇති මෙම ආයතනයට අදාල කාර්යභාරය මෙන්ම ඉන් බැහැර වූ ක්ෂේත්‍රයන් වෙත ද තම අධ්‍යාපන හා සේවා පහසුකම් සැපයීමේ කාර්යයෙහි නිරතවන්නා වූ ජාතික ආයතනයකි.


## 1.1. දැක්ම

ශ්‍රී ලංකාව තුළ තිරසාර පැවැත්මක් සහිත නිර්මාණශීලී හා නව්‍යකරණයෙන් යුත්, ගෝලීය සම්බන්ධතාවයන්ගෙන් පිරිපුන් සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම.

## 1.2. මෙහෙවර

යහපාලනයෙන් හා නිර්මාණශීලීත්වයෙන් යුත් සාමූහික සහභාගිත්වය තහවුරු කෙරෙන ස්වාධීන හා තිරසාර සමුපකාර ව්‍යවසායයක් බිහිකිරීම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම.

## 1.3. පස්විධ වටිනාකම්




## 1.4. අභිමතාර්ථ

මෙම ආයතනයේ කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා අභිමතාර්ථ 06 ක් ඔස්සේ කාර්ය භාරය සැලසුම් කෙරේ.

| | |
|---|---|
| **1. අභිමතාර්ථය** | සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති හා කළමනාකරණය. |
| **2. අභිමතාර්ථය** | ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයට ප්‍රමුඛතාවය දෙමින් මානව ප්‍රාග්ධනය ඵලදායි ලෙස සංවර්ධනය කිරීම. |
| **3. අභිමතාර්ථය** | සමුපකාර ව්‍යාපාරයට අදාළව ඉටු කරනු ලැබූ පර්යේෂණ සංවර්ධන කාර්යයන් පැවතීම. |
| **4. අභිමතාර්ථය** | සමුපකාර ප්‍රතිපත්ති සිවිල් සමාජය තුළ ස්ථාපිතවීම. |
| **5. අභිමතාර්ථය** | පුහුණුව හා සංවර්ධන සේවා අපේක්ෂාකරන පාර්ශවයන් සඳහා පහසුකම් සපයා තිබීම. |
| **6. අභිමතාර්ථය** | ජාත්‍යන්තර සමුපකාර සංවිධාන හා වෙනත් විදේශීය සමුපකාර සංවිධාන සමඟ ශක්තිමත් වූ සබඳතාවයන් හා ගෝලීය නව ප්‍රවනතාවයන් සහිත ලාංකීය සමුපකාර ව්‍යාපාරයක් පැවතීම. |

## 1.5. ශක්තීන් හා දුර්වලතා



## 1.6. කාර්ය භාරය

1945 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය 2001 අංක 01 දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සංස්ථාපනය කිරීමේ පනත මගින් ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද අවස්ථාවේ දී පනතේ පළමු කොටසේ 04 වන වගන්තිය මගින් පහත සඳහන් කාර්යයන් ආයතනය වෙත පවරා ඇත.

i. සමුපකාර සංවර්ධනයට අදාළ ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකිරීම.
ii. අන්තර් පුද්ගල සම්බන්ධතා පදනම් කරගනිමින් සහ නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමුපකාර සංවර්ධනය පිළිබඳ පුහුණුව සැපයීම.
iii. සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
iv. සමුපකාර සංවර්ධනයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන් අතර,අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් සහ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
v. සමුපකාර සංවර්ධනයට අදාළ දත්ත රැස්කිරීම අරබයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකිරීම සහ රැස් කරන ලද එම දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතළ කිරීම.
vi. සමුපකාර සංවර්ධනයට අදාළ විෂයයන් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සහ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ එවැනි පාඨමාලා හදාරා නියමිත විභාගවලින් සමත්වන තැනැත්තන්ට සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනැමීම.
vii. කළමනාකරණ නිපුණතා අවශ්‍ය වන සමුපකාර ව්‍යවසායන් භාර ගෙන කළමනාකරණය කිරීම.
viii. සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම.
ix. සමුපකාර ගම්මාන, ආදර්ශ සමුපකාර වෙළඳ මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම, සහ
x. ආයතනයේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටුකරන,ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## 1.7. සම්පත්

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර - මඩවල මාර්ගයේ පොල්ගොල්ල මහවැලි හැරවුම් වේල්ල ආසන්නයේ පොල්ගොල්ල අධ්‍යාපන කේන්ද්‍රස්ථානය තුළ ස්ථානගතව ඇති අප ආයතනය මෙරට සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත ප්‍රවර්ධනය කිරීමෙහිලා අක්කර 20ක භූමියක පිහිටුවා ඇති රාජ්‍ය අධ්‍යාපන ආයතනයකි.

### 1.7.1. මානව සම්පත

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය භෞතික හා මානව සම්පතින් පොහොසත් අධ්‍යාපන අයතනයක් වන අතර කළමනාකරණ මණ්ඩලයේ හා අධ්‍යයන මණ්ඩලයේ කළමනාකරණ

හා ප්‍රතිපත්තිමය තීරණ මත ආයතනික කටයුතු පවත්වාගෙන යාමට කාර්ය මණ්ඩලය සැලසුම් කර ඇත.

#### 1.7.1.1. **කළමනාකරණ මණ්ඩලය**

2001 අංක 01 දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීමේ පනතේ 2 කොටසේ 5 වන වගන්තිය අනුව ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම, කළමනාකරණ මණ්ඩලය වෙත පැවරෙන්නේය. ඒ අනුව කළමනාකරණ මණ්ඩලය ආයතනයේ ඉහලම පරිපාලන ඒකකය වේ.

පනතේ 2 කොටසේ 6(1) උප වගන්තිය මගින් ආයතනික කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය දක්වා ඇති අතර ඒ අනුව පහත දැක්වෙන පත්කල සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතුය.

| | | |
|---|---|---|
| නිල බලයෙන් පත්වන සාමාජිකයන් | සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස, තත් කාලයේ තනතුර දරන්නා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු | 01 |
| | මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් | 01 |
| | ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපතිවරයා | 01 |
| | පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා | 01 |
| පත් කරනු ලබන සාමාජිකයන් | සමුපකාර ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් සහ කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙක් | 03 |
| | උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, | 01 |
| | මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්. | 01 |
| **එකතුව** | | **09** |

කළමනාකරණ මණ්ඩලයට ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පැවරෙන්නේය. එමෙන්ම, ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මේ පනතින් ආයතනය වෙත පවරා දී ඇති, පනවා ඇති හෝ භාරකොට ඇති බලතල කාර්ය සහ කර්තව්‍ය කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය.

මෙයට අමතරව ආයතනයේ සම්පත්, අරමුණු හා පරමාර්ථ ලඟා කර ගැනීම සඳහා මෙහෙයවමින් වාර්ෂික සංවර්ධන සැලසුම්, වාර්ෂික අයවැය ලේඛන, ඇගයීම හා

අනුමත කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ආයතනයේ කාර්යසාධනය කාලීනව අධීක්ෂණය කිරීම හා ඇගයීම, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික මූල්‍ය වාර්තා හා විගණකාධිපති වාර්තා විශ්ලේෂණය කිරීම හා ඇගයීම, ප්‍රතිඵල, අපේක්ෂිත ඉලක්ක හා නොසැසඳේ නම් අපේක්ෂිත අරමුණ ලඟා කර ගැනීමට අවශ්‍ය පිළියම් යෙදීම කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේය.

සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| | තනතුර | නම |
|---|---|---|
| 1. | කළමනාකරණ මණ්ඩල සභාපති | **කේ. ඩී. ඒන්. ලලිත් ගගේවත්ත මහතා**<br>**එම්.ආර්.එම්.හම්ජාඩ් මහතා** |
| 2. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **කේ.ඩී.එන්.රංජිත් අශෝක මහතා**<br>( ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය)<br>ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| 3. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **එල්.ඒ.සුජාතා විජේසිංහ මිය -** අධ්‍යක්ෂ ජනරාල්<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය)<br>**ජී.එච්.එම්.ඒ.ප්‍රේමසිංහ මහතා** - අධ්‍යක්ෂ ජනරාල්<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය)<br>ජාතික සමූපකාර සංවර්ධන ආයතනය |
| 4. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **සමන් ජයසිංහ මහතා**<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය)<br>අතිරේක ලේකම් (සමුපකාර), කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| 5. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **එස්.එල්.නසීර් මහතා**<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (මධ්‍යම රජය) |
| 6. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **කේ.කේ.එස්..ඒ. පෙරේරා මයා**<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) - අධ්‍යක්ෂක (මුදල්), මුදල් අමාත්‍යාංශය |
| 7. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **ජී.ආර්.කේ.එස්.ගනේගොඩ මහතා**<br>(ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය - ii පන්තිය )<br>නගර සැළසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| 8. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **ඩබ්ලිව්. ලලිත් ඒ. පීරිස් මහතා**<br>සභාපති ජාතික සමූපකාර මණ්ඩලය |
| 9. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **එම්.එස්.එම්.රිස්මි මහතා**<br>අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිළධාරී . ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය |
| 10. | කළමනාකරණ මණ්ඩල සාමාජික | **එල්.බී.දසනායක මහතා**<br>සභාපති, සී/ස තාක්ෂණ සංවර්ධන සමූපකාර සමිතිය |

කළමනාකරණ මණ්ඩල රැස්වීමක් සඳහා සණපූර්ණය සමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, යටත් පිරිසෙන් මාස 3 කට වරක්වත් කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු බවට පනත මගින් විධිවිධාන සළසා ඇත.

සමාලෝචිත 2018 වසර තුළ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 06 ක් පවත්වා ඇත.

| | නම | රැස්වීම් පැවැත්වූ දින | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2/5 | 3/26 | 4/10 | 6/13 | 8/17 | 8/27 |
| 1. | ලලිත් ගගේවත්ත මහතා | ✓ | ✓ | ✓ | - | - | - |
| 2. | රංජිත් අශෝක මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | - |
| 3. | එල්.ඒ.සුජාතා විජේසිංහ මිය | ✓ | ✓ | - | - | - | - |
| 4. | එස්.එල්.නසීර් මහතා | ✓ | ab | ✓ | ✓ | ✓ | ab |
| 5. | කේ.කේ.එස්.ඒ.පෙරේරා මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 6. | ජී.ආර්.කේ.එස්.ගනේගොඩ මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 7. | ඩබ්ලිව්. ලලිත් පීරිස් මහතා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 8. | එම්.එස්.එම්.රිස්මි මහතා | ✓ | ✓ | ✓ | ✓ | ab | ✓ |
| 9. | එම්.ආර්.එම්.හම්ජාඩ් මහතා | - | - | - | - | ✓ | ✓ |
| 10. | ජී.එච්.එම්.ඒ. ප්‍රේමසිංහ මහතා | - | - | - | - | ✓ | ✓ |
| 11. | එල්.බී.දසනායක මහතා | - | - | - | - | ✓ | ab |
| 12. | සමන් ජයසිංහ මහතා | - | - | - | - | - | ✓ |

**- සාමාජිකත්වය නොමැති**

### 1.7.1.2. අධ්‍යයන මණ්ඩලය

2001 අංක 01 දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීමේ පනතේ 03 කොටස 12 වන වගන්තිය අනුව ආයතනයේ අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා | 01 |
| 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල නියෝජිතයෙක් | 01 |
| විභාග කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් | 01 |
| සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් | 01 |
| අමාත්‍යවරයාගේ මතය අනුව, කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ පුහුණුව ලබා ඇත්තා වූ සමුපකාර අංශයෙන් හෝ පෞද්ගලික අංශයෙන් තෝරා ගනු ලබන තැනැත්තෙකු. | 01 |
| **එකතුව** | **05** |

පනතේ 12(03) උප වගන්තිය අනුව අධ්‍යයන මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම, වසර 03 කාලයක් සඳහා ආයතනයේ පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර අධ්‍යයන මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූර්ණය සමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුයි.

### ආයතනික අධ්‍යයන මණ්ඩලයේ කාර්යයන්

පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව කලමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසින් පහත දැක්වෙන කර්තව්‍යය ඉටුකළ යුතුය.

(අ) ආයතනය සඳහා පුහුණු හා පර්යේෂණ වැඩ සටහන් සකස් කිරීම.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා විෂයමාලා හා කරුණු සංවර්ධනය කිරීම.

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විභාග සඳහා නිර්දේශ පත්‍රිකා සකස් කිරීම සහ අනුමත කිරීම, විභාග අධීක්ෂණය කිරීම සහ ආයතනයේ අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඇගයීමට අදාළ යෝජනා ක්‍රම පිළියෙල කිරීම.

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව නිකුත් කිරීම සහ,

(ඉ) ශිෂ්‍යත්ව, නිල ලාංඡන සහ වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීමට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

සමාලෝචිත වසර තුළ අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| නම | තනතුර |
|---|---|
| සුජාතා විජේසිංහ මහත්මිය | අධ්‍යයන මණ්ඩල සභාපති,<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,<br>පොල්ගොල්ල<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) |
| පී.එච්.එම්.ඒ ප්‍රේමසිංහ මහතා | අධ්‍යයන මණ්ඩල සභාපති,<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,<br>පොල්ගොල්ල<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) |
| ගයාත්‍රී අබේගුණසේකර මහත්මිය | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>අතිරේක විභාග කොමසාරිස් ජනරාල්,<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>පැලවත්ත, බත්තරමුල්ල. |
| එච්.එම් ප්‍රේමරත්න මහතා | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>විශ්වවිද්‍යාල කොමිෂන් සභා නියෝජිත,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| එස්.එල්.නසීර් මහතා<br>(ශ්‍රී ලංකා පරිපාලන සේවය - විශේෂ ශ්‍රේණිය) | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නියෝජිත, |
| පත්කර නොමැත | අධ්‍යයන මණ්ඩල සාමාජික,<br>විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශිත සාමාජික, |

සමාලෝචිත 2018 වර්ෂයේ අධ්‍යයන මංඩල රැස්වීම් 02 ක් පවත්වා ඇත

| නම | සහභාගිත්වය | |
|---|---|---|
| | 2018.01.24 | 2018.09.11 |
| සුජාතා විජේසිංහ මහත්මිය | ✓ | - |
| පී.එච්.එම්.ඒ ප්‍රේමසිංහ මහතා | - | ✓ |
| ගයාත්‍රී අබේගුණසේකර මහත්මිය | ✓ | ✓ |
| එස්.එල්.නසීර් මහතා | ✓ | ✓ |
| එච්.එම් ප්‍රේමරත්න මහතා | ✓ | ✓ |

- සාමාජිකත්වය නොමැති

### 1.7.1.3. විගණන හා කළමණාකරණ කමිටුව.

යහපාලන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව යමින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2010.12.14 දිනැති චක්‍රලේඛ අංක PED/55 මගින් පෙන්වා දී ඇති පරිදි ආයතනික කටයුතු සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටුව ආයතනික කළමනාකරණ මණ්ඩලය විසින් පත්කර ඇත. මෙම කමිටුව කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් හා රජයේ විගණන අංශ නියෝජනයෙන් සමන්විතව ඇත.

| නම | තනතුර |
|---|---|
| කේ. කේ. එස්. ඒ. පෙරේරා මහතා<br>කමිටු සභාපති<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| ජී .ආර්. කේ. එස්. ගනේගොඩ මහතා<br>කමිටු සාමාජික<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | ගණකාධිකාරී - නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| එම්. එස්. එම්. රිස්මි මහතා<br>කමිටු සාමාජික<br>කළමනාකරණ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ - පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය |
| ඒ. එන්. එන්. පෙරේරා මහත්මිය<br>කමිටු සාමාජික | රජයේ විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය |
| බී. කේ. එම්. ජේ. රුද්‍රිගු මහත්මිය<br>කමිටු සාමාජික | ප්‍රධාන අභ්‍යන්තර විගණක - කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය |

### 1.7.1.4. ආයතනයේ කාර්ය මණ්ඩලය

ආයතනික පනතේ 04 වන කොටස 16(1) උප වගන්තිය අනුව කලමනාකරණ මණ්ඩලය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේය. අධ්‍යක්ෂ ජනරාල් යටතේ ලේඛකාධිකාරි ප්‍රමුඛ පරිපාලන කටයුතු ආයතන හා පරිපාලන, මූල්‍ය, නේවාසික, මුද්‍රණ, ශ්‍රව්‍ය දෘෂ්‍ය යන අංශ ඔස්සේ කළමනාකරණය කෙරේ.

ආයතනික අධ්‍යයන අංශය අධ්‍යක්ෂක (අධ්‍යයන හා සංවර්ධන)ගේ මග පෙන්වීම යටතේ කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ පර්යේෂක, පර්යේෂක, ජ්‍යෙෂ්ඨ පුස්තකාලාධිපති හා පුස්තකාලාධිපති තනතුරු සහ පරිගණක අංශයේ උපදේශක කාර්ය මණ්ඩලය අධ්‍යයන අංශය ශක්තිමත් කරයි.

පිරිස්බල තක්සේරුවක් මගින් ආයතනික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි තනතුරු 71 ක් හදුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවෙන් අනුමැතිය ලබා ගෙන ඇත. අනුමත කාර්ය මණ්ඩල තොරතුරු පහත පරිදි වේ.

| තනතුරු කාණ්ඩය | වැටුප් කේතය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | HM 2-1 | අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | HM 1-1 | ලේඛකාධිකාරි | 01 |
| | | අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) | 01 |
| ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ | AR – 2 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 04 |
| | | ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති | 01 |
| | | ජ්‍යෙෂ්ඨ පර්යේෂක | 01 |
| අධ්‍යයන හා පර්යේෂණ | AR – 1 | කථිකාචාර්ය/ සහකාර කථිකාචාර්ය | 08 |
| | | පුස්තකාලයාධිපති/සහකාර පුස්තකාලයාධිපති | 01 |
| | | පර්යේෂක/සහකාර පර්යේෂක | 01 |
| කළමනාකරණ | MM 1-2 | සහකාර ලේඛකාධිකාරි | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | 01 |
| | | අභ්‍යන්තර විගණක | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (නේවාසිකාගාර) | 01 |
| කණිෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් | JM 1-1 | ගිණුම් නිලධාරි | 02 |
| | | පරිපාලන නිලධාරි (විභාග) | 01 |
| | | පරිපාලන නිලධාරි (පරිපාලන/මානව සම්පත්) | 01 |
| | | පරිපාලන නිලධාරි (ශිෂ්‍ය කටයුතු) | 01 |
| | | ප්‍රසම්පාදන හා නඩත්තු නිලධාරි | 01 |
| | | අලෙවි ප්‍රවර්ධන හා මුද්‍රණ නිලධාරි | 01 |
| | | ප්‍රවාහන නිලධාරි | 01 |
| | | ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිලධාරි | 01 |
| | | නේවාසිකාගාරභාර නිලධාරි | 01 |
| බලාත්කම කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරින් | MA 5-3 | පරිගණක වැඩසටහන් සම්පාදක | 01 |
| ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරින් | MA 4 | පරිගණක උපදේශක | 03 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | MA 2-1 | ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහකාර | 01 |
| | | මුද්‍රණ යන්ත්‍ර තාක්ෂණ සහකාර | 01 |
| | | පද්ධති ක්‍රියාකරු | 01 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | කළමනාකරණ සහකාර | 10 |
| ප්‍රාථමික ගණය - ශිල්පීය | PL – 3 | රියදුරු | 06 |
| ප්‍රාථමික ගණය - අර්ධ ශිල්පීය | PL – 2 | සංචාරක බංගලා භාරකරු | 01 |
| ප්‍රාථමික ගණය - ශිල්පීය නොවන | PL – 1 | කාර්යාල සහායක | 14 |
| **එකතුව** | | | **71** |

ආයතනික අනුමත කාර්ය මණ්ඩලය 71 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට ආයතනය තුල නියුක්ත සේවක සංඛ්‍යාව 30 ක් විය. එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 41 කි.

ආයතනයේ මෙම කාර්ය මණ්ඩලයට අමතරව රේඛීය අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද සංවර්ධන නිළධාරීනියන් හත් දෙනෙකු මෙම ආයතනය වෙත 2015 මැයි මස සිට අනුයුක්ත කර ඇති අතර ඔවුන් ද ආයතනික කටයුතු සඳහා විශාල දායකත්වයක් ලබාදේ.

**2018.12.31 දිනට අනුමත තනතුරු හා සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු**

| අනු අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 |
| 2. | ලේඛකාධිකාරී | 01 | 01 | 00 |
| 3. | අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) | 01 | 01 | 00 |
| 4. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 04 | 02 | 02 |
| 5. | ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති/ පුස්තකාලයාධිපති | 01 | 01 | 0 |
| 6. | ජ්‍යෙෂ්ඨ පර්යේෂක | 01 | 00 | 01 |
| 7. | කථිකාචාර්ය | 04 | 0 | 04 |
| 8. | සහකාර කථිකාචාර්ය | 04 | 02 | 02 |
| 9. | සහකාර පුස්තකාලයාධිපති | 01 | 01 | 0 |
| 10. | සහකාර පර්යේෂක | 01 | 0 | 01 |
| 11. | සහකාර අධ්‍යක්ෂ (නේවාසිකාගාර) | 01 | 00 | 01 |
| 12. | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 01 | 01 | 0 |
| 13. | සහකාර ලේඛකාධිකාරී | 01 | 01 | 0 |
| 14. | අභ්‍යන්තර විගණක | 01 | 01 | 00 |
| 15. | ගිණුම් නිලධාරී | 02 | 01 | 01 |
| 16. | පරිපාලන නිලධාරී (විභාග) | 01 | 00 | 01 |
| 17. | පරිපාලන නිලධාරී (පරිපාලන/මානව සම්පත්) | 01 | 01 | 0 |
| 18. | ප්‍රසම්පාදන හා නඩත්තු නිලධාරී | 01 | 00 | 01 |
| 19. | ප්‍රවාහන නිලධාරී | 01 | 00 | 01 |
| 20. | පරිපාලන නිලධාරී (ශිෂ්‍ය කටයුතු) | 01 | 01 | 0 |
| 21. | අලෙවි ප්‍රවර්ධන හා මුද්‍රණ නිලධාරී | 01 | 01 | 00 |
| 22. | ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිලධාරී | 01 | 00 | 01 |
| 23. | නේවාසිකාගාර භාර නිලධාරී | 01 | 00 | 00 |
| 24. | පරිගණක වැඩසටහන් ප්‍රකමණකරු | 01 | 01 | 0 |
| 25. | පරිගණක උපදේශක | 03 | 01 | 02 |
| 26. | ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ සහායක | 01 | 00 | 1 |
| 27. | මුද්‍රණ යන්ත්‍ර තාක්ෂණ සහායක | 01 | 01 | 0 |
| 28. | පද්ධති ක්‍රියාකරු | 01 | 00 | 01 |
| 29. | කළමනාකරණ සහකාර | 10 | 01 | 09 |
| 30. | රියදුරු/කාර්යාල සහායක | 06 | 03 | 03 |
| 31. | සංචාරක බංගලා භාරකරු | 01 | 01 | 0 |
| 32. | කාර්යාල සහායක | 14 | 05 | 09 |
| 33. | **එකතුව** | | **29** | **41** |
| 34. | *සහකාර නේවාසික කළමණාකරු | | 01 | 0 |
| 35. | **මුළු එකතුව** | 71 | **30** | 41 |

*** තනතුර පෞද්ගලික වන සේ පිහිටුවා ඇත.**

මානව සම්පත් සංවර්ධනය ආයතනික කාර්ය මණ්ඩල පුහුණු කිරීම් යටතේ 2018 වසර තුල දේශීය විදේශීය පුහුණු වැඩසටහන් වෙනුවෙන් කාර්ය මණ්ඩලය යොමුකර ඇත.

### 1.7.2. ආයතනික භෞතික සම්පත්

ආයතනික භෞතික සම්පත් අක්කර 21 කට ආසන්න සමස්ථ භූමිභාගය තුළ පිහිටා ඇති අතර එය භාවිතයේ හා ආදායම් උත්පාදන මුලාශ්‍ර ස්වරූපය අනුව පහත පරිදි උප ක්ෂේත්‍ර ගත කළ හැක.

- කාර්යාල පරිශ්‍රය
- දේශන ශාලා
- සම්මන්ත්‍රණ ශාලා
- නේවාසික පහසුකම්
- වෙනත් භෞතික හා ප්‍රාග්ධන සම්පත්

#### 1.7.2.1. කාර්යාල පරිශ්‍රය

ආයතනික ප්‍රධාන පරිපාලන ඒකකය සහිත කාර්යාල පරිශ්‍රය ගොඩනැගිලි 3 කින් සමන්විතය.ආයතනික සමස්ත පරිපාලන කටයුතු මෙහෙය වන අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය හා විභාග අංශය ස්ථාපිත ගොඩනැගිල්ල මහල් දෙකකින් යුත් වර්ග අඩි 1200 සහිත ගොඩනැගිල්ලක පිහිටුවා ඇත.

පරිපාලන, මුල්‍ය හා අධ්‍යයන අංශයද අධ්‍යයන කාර්යය මණ්ඩලයේ රාජකාරි නිල කාමරද ඇතුලත් පරිශ්‍රය ප්‍රධාන මෙහෙයුම් පරිශ්‍රය වර්ග අඩි 10,000 කට ආසන්නය.

පැරණි පරිපාලන ගොඩනැගිල්ල නේවාසිකාගර කර්යාලය,ලේඛණාගාරය, විභාග අංශයේ ලේඛණාගාරය, ප්‍රධාන තොග ගබඩාව, සමුපකාර කෞතුකාගාරය හා තවත් කාර්යාල කාමර කිහිපයකින් සමන්විතය. මෙම ගොඩනැගිල්ල තුල රජයේ විගණන අංශය ස්තාපිත කර ඇති අතර ඒ වෙනුවෙන් කාමර 03 ක් වෙන් කර දී ඇත.

#### 1.7.2.2. දේශන ශාලා

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යයන කටයුතු සඳහා ආයතනික ප්‍රධාන පරිශ්‍රය තුළ යොදාගත හැකි දේශන ශාලා රැසක් පවතී.

**B ශාලාව**

ආයතනයේ ඓතිහාසික වටිනාකමක් සහිත සුව පහසු ආසන 100 කින් සමන්විත ශාලාව ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් වලින් යුක්තය.



**රොච්ඩේල් ශාලාව**

ආසන 100 කින් සමන්විත ශාලාව ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සහිත මෙම දේශන ශාලාව ඉතා නිදහස් පරිසරයක අධ්‍යයන කටයුතු වල යෙදීමට අපේක්ෂිත විද්‍යාර්ථීන්ගේ විශේෂ ඉල්ලුමක් සහිත ශාලාවකි.

**C 1, C2 හා C3 දේශන ශාලා**



වායුසමනය කළ නවීන අධ්‍යයන ආසන යොදා නවීකරණය කර ඇති මෙම දේශන ශාලා කුඩා කණ්ඩායම් දේශන කටයුතු සඳහා වඩාත් යෝග්‍ය වේ. C -1ශාලාවේ ආසන 40 ක් හා C -2ශාලාවේ ආසන 40 ක් ද C -3ශාලාවේ ආසන 30 ක් බැගින් ආසන 110 ක් ඇති අතර ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් හා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් පහසුකම් වලින් යුක්තය.

**බහුකාර්ය ගොඩනැගිල්ල**




නව තොරතුරු තාක්ෂණ ඒකකය සහිත වෘත්තීය අධ්‍යාපන අංශය ස්ථාපිත කර ඇති බහුකාර්ය ගොඩනැගිල්ල තුල කුඩා ප්‍රමාණයේ සම්මන්ත්‍රණ ශාලාවක් ද ඇතුලත් ව දේශන ශාලා පහක් ස්ථාන ගත කර ඇති අතර එම සියලුම දේශන ශාලා ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් ඇතුලත්ව මූලික අධ්‍යයන උපකරණ වලින් සමන්විත අතර සුව පහසු නවීන අධ්‍යයන ආසන වලින් යුක්තය.



මෙම ගොඩනැගිල්ලෙහි පවත්නා තොරතුරු තාක්ෂණ ඒකකයේ විද්‍යාගාර දෙක තුල නවතම මාදිලියේ පරිගණක 66 ක් අධ්‍යයන කටයුතු සඳහා වෙන්කර ඇත.


මෙම ඒකකය තුල දේශන ශාලා අංක 01 හි ශිෂ්‍යයන් 45 ක් සඳහා ද දේශන ශාලා අංක 02 ,හි ශිෂ්‍යයන් 80 ක් සඳහා ද, දේශන ශාලා අංක 03 හි ශිෂ්‍යයන් 50ක් ද,දේශන ශාලා අංක 04 හි ශිෂ්‍යයන් 45 ක් සඳහා හා කුඩා ශ්‍රවනාගාරයේ

ශිෂ්‍යයන් 80 ක් ද වශයෙන් සම්පූර්ණයෙන් විද්‍යාර්ථයින් 300 ක් වෙනුවෙන් උසස් තත්ත්වයේ පහසුකම් සපයයි.

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සියලුම දේශණ ශාලා එකවර පුහුණුලාභීන් 430 ක් සඳහා අධ්‍යයන කටයුතු සඳහා සපයන අතර මෙම දේශන ශාලා වලට අමතරව සම්මන්ත්‍රණ ශාලා පහසුකම් ද අධ්‍යයන හා වෙනත් සැසි සඳහා ගොඩනගා ඇත.

### 1.7.2.3. සම්මන්ත්‍රණ ශාලා

**ජාතික සමුපකාර සංවර්ධන ආයතනික ශ්‍රවනාගාරය**







සමුපකාර හා වෙනත් ආයතනයන් හි විවිධ අවශ්‍යතා පරිදි පුහුණු හා සම්මන්ත්‍රණ පැවැත්වීමට අවශ්‍ය භෞතික ඉඩපහසුකම් සැපයීම, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීම,ජාතික හා ජාත්‍යන්තර ප්‍රසාංගික අත්දැකීම් සඳහා පහසුකම් සැපීම හා ආයතනික ආදායම් උත්පාදනය යන අරමුණු ඔස්සේ අගනුවරින් බැහැරව ඉදිකල විශිෂ්ඨතම බහුකාර්ය ශ්‍රවනාගාරය ජාතික සමුපකාර සංවර්ධන ආයතනික ශ්‍රවනාගාරයයි.

බැල්කනිය සහිත ප්‍රධාන ශ්‍රවනාගාරය තුල ආසන 1118 කින් යුක්ත අතර සම්පූර්ණයෙන්ම වායුසමනය කර ඇති මෙම ශ්‍රවනාගාරයේ ඉඩකඩ පහත පරිදි වෙයි.

| විස්තරය | ඉඩ ප්‍රමාණය |
|---|---|
| සම්පූර්ණ ගොඩනැල්ලේ වර්ගඵලය | 3723.63 වර්ගමීටර |
| ප්‍රධාන ශ්‍රවනාගාරය (බැල්කනිය හා පහත මාලය) | 1505.5 වර්ගමීටර |
| ප්‍රධාන වේදිකාව | 259 වර්ගමීටර |
| ශ්‍රවනාගාරය ආසන සංඛ්‍යාව | 1118 (711+407) |
| අමුත්තන්ගේ විවේක ඉඩකඩ | 1000 වර්ගමීටර |
| කාර්යාල ඉඩකඩ | 240 වර්ගමීටර |
| දේශන ශාලා හා සෙසු කලාකරුවන් සඳහා වූ ඉඩකඩ | 719.13 වර්ගමීටර |

විදුලි ආලෝකකරණ පහසුකම් හා ශබ්ද පරිපාලන පහසුකම් හා භෝජනාගාර පහසුකම මෙන්ම වාහන 300 ක් පමණ ගාල්කිරීමේ රථ ගාලකින් යුත් මෙම ශ්‍රවනාගාරයේ 2018 වර්ෂය තුල පහත ගාස්තු ක්‍රමය ඔස්සේ වැඩසටහන් පවත්වා රුපියල් මිලියන 6.83 ක මුදලක් උපයා ඇත.

| ආයතනික අංශය | වැඩසටහනේ ස්වරූපය | |
|---|---|---|
| | ප්‍රාසාංගික (පැය 06) | ප්‍රාසාංගික නොවන (පැය 06) |
| රාජ්‍ය හා සමුපකාරික ආයතන | රු. 225,000.00 | රු. 225,000.00 |
| පෞද්ගලික අංශය | රු. 300,000.00 | රු. 250,000.00 (දිවා) |
| | | රු. 275,000.00 (රාත්‍රී) |
| අතිරේක පැය 01 ක් සඳහා මූලික ගාස්තුවෙන් 15% ක් අමතරව අයකෙරෙන අතර පෙරහුරු කටයුතු වෙනුවෙන් පැය 02 ක් වෙනුවෙන් රු.75,000.00 මුදලක් අයකරනු ලැබේ. | | |

**රත්නායක ශාලාව**



සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීම සඳහා යෝග්‍ය වන පරිදි ආසන 55 කින් යුත් මෙම ශාලාව බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ, ශබ්ද විකාශන පද්ධතියකින් සමන්විත වායු සමීකරණය කරන ලද ශාලාවකි.

සමාලෝචිත වසර තුල රු.මි 9.7 මුදලක් වැයකර මෙම ශාලාව හා නේවාසිකාගාරය ද ඇතුලත්ව සම්පූර්ණයෙන් නවීකරණ කටයුතු අවසන් කරනු ලැබ ඇත.

**නව රොච්ඩේල් ශාලාව**



ආසන 80 කින් සමන්විත කණ්ඩායම් ක්‍රියාකාරකම් සහිත අධ්‍යයන හා පුහුණු සැසි සඳහා වඩාත් උචිත වන පරිදි වායුසමනය කළ මෙම ශාලාව බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ, ශබ්ද විකාශන පද්ධතියකින් සමන්විත වේ.

**වින්සන්ට් සුභසිංහ ශාලාව**



නවීන ශබ්ද පරිපාලන පද්ධතියක් සහිත වේදිකා නාට්‍ය හා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ පහසුකම්ද ඇතුළුව අනෙකුත් කාර්යයන් සඳහාද පහසුකම් සහිතව ආසන 600 කින් යුත් මෙම කුඩා ශ්‍රවනාගාරය ප්‍රදේශයේ ශ්‍රවනාගාර අවශ්‍යතාවයන් තෘප්තිමත් කරයි.

අවම ගාස්තු ක්‍රමයක් යටතේ බාහිර ආයතන වෙත මෙම ශාලාව වෙන්කරගැනීමට පහසුකම් සලසා ඇත්තේ ආයතනික සමාජයීය වගකීම ඉටුකිරීමේ අභිලාශයෙනි.

සමස්ථයක් වශයෙන් ගත්කල අධ්‍යයන කටයුතු සිදු කිරීම නවීන ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම්වලින් සමන්විත දේශන ශාලා හා සම්මන්ත්‍රණශාලා 14 ක් ආයතනය සතු වන අතර ඒවායේ මුළු ධාරිතාවය ආසන 2,218 කි. ශ්‍රවනාගාරය හැර එම අගය 1100 ක් පමණි, විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | | ශාලාව | ආසන සංඛ්‍යාව |
|---|---|---|---|
| i. | දේශන ශාලා | නව රොච්ඩේල් ශාලාව | 60 |
| ii. | | B ශාලාව | 80 |
| iii. | | රොච්ඩෙල් ශාලාව | 60 |
| iv. | | C1 දේශනශාලාව | 40 |
| v. | | C2 දේශන ශාලාව | 40 |
| vi. | | C3 දේශන ශාලාව | 20 |
| vii. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 01 | 70 |
| viii. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 02 | 45 |
| ix. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 03 | 40 |
| x. | | බහුකාර්ය ගොඩනැගිල්ල දේශන ශාලා අංක - 04 | 65 |

| | | | |
|---|---|---|---|
| xi. | සම්මන්ත්‍රණ ශාලා | ශ්‍රවණාගාරය | 1118 |
| xii. | | වින්සන්ට් සුබසිංහ ශාලාව | 450 |
| xiii. | | රත්නායක ශාලාව | 55 |
| xiv. | | බහුකාර්ය ගොඩනැගිල්ල සම්මන්ත්‍රණ ශාලාව | 75 |
| **එකතුව** | | | **2218** |

### 1.7.2.4. නේවාසික පහසුකම්

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නේවාසික පුහුණු ආයතනයක් වශයෙන් අධ්‍යයන කාර්යයේදී දිවයින පුරා විසිරී සිටින විද්‍යාර්ථීන් වෙනුවෙන් නේවාසික අධ්‍යාපන අවස්ථාව හිමිකර දී ඇති නේවාසික පහසුකම් කාණ්ඩ කිහිපයක් යටතේ ගොඩනගා ඇත.

නේවාසිකාගාර පද්ධතිය මෙම ආයතනයේ ප්‍රධාන වත්කමක් හා ඓතිහාසික සංකේතයක් ද වන්නේය. 2016 හා 2017 වාර්ෂික භාණ්ඩාගාර ප්‍රතිපාදන ඔස්සේ රු.මි 40 කට ආසන්න මුදලක් වැයකර ශිෂ්‍ය නේවාසිකාගාර D,E,F,G,H ද රත්නායක හා නව රත්නායක වාණිජමය නේවාසිකාගාර ද සම්පූර්ණයෙන් නවීකරණය කරනු ලැබ ඇත.

**ශිෂ්‍ය නේවාසිකාගාර**



එක් මහලක කාමර 10 බැගින් හා පොදු නාන කාමර පද්ධති 02 බැගින් වූ මහල් 2 කින් යුත් නේවාසිකාගාර 4 ක් සහිත ප්‍රධාන ශිෂ්‍ය නේවාසිකාගාර පද්ධතිය ආයතනයේ සංකේතයක් වන්නේය. මෙහි සෑම කාමරයකම නේවාසිකයින් දෙදෙනෙකු සඳහා තනි ඇඳන් 2 ක් හා අනෙකුත් පහසුකම් සහිතව ගොඩනගා ඇත.

සම්පූර්ණ නේවාසික ධාරිතාවය නේවාසිකයන් 160 ක් වන අතර ඉතා මනරම් හා නිදහස් පරිසරයක ස්ථාන ගත කර ඇත.



ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා අලුතින් එක් කරන ලද H නේවාසිකාගාරය පොදු නාන කාමර සහිත නේවාසික කාමර 04 කින් යුත් සම්පූර්ණ නේවාසික ධාරිතාවය 18 කි. සමස්ත නේවාසික ධාරිතාවය නේවාසිකයන් 178 ක් සඳහා වේ.

**වාණිජ නේවාසිකාගාර**

ශිෂ්‍ය නේවාසිකාගාරයට අයත් නොවන අනෙකුත් බාහිර පාර්ශවයන් වෙත නේවාසික පහසුකම් ලබා දීම සඳහා ගොඩනගා ඇති නේවාසිකාගාර පද්ධතිය නේවාසිකාගාර 4 කින් සමන්විත වේ.

**නව රත්නායක නේවාසිකාගාරය**

විශේෂ පුද්ගලයන් හා විදේශිය අධ්‍යයන කණ්ඩායම් ඉලක්ක ගත කර උණුවතුර පහසුකම් සහිත යාබඳ නාන කාමර වලින් යුත් වායුසමනය කළ නව රත්නායක නේවාසිකාගාරය තනි පුද්ගල කාමර 18 කින් හා ද්විත්ව කාමර 4 කින් සමන්විත වන අතර සමස්ත නේවාසික ධාරිතාවය 26 කි.

**රත්නායක නේවාසිකාගාරය**

උණුවතුර පහසුකම් සහිත නාන කාමර වලින් සමන්විත වායුසමනය කළ රත්නායක නේවාසිකාගාරය ද්විත්ව කාමර 14 කින් සමන්විත වන අතර සමස්ත නේවාසික ධාරිතාවය 26 කි.

**රත්නායක නිවාස**

පවුලක සමාජිකයන්, සමුපකාර සමිතියක, එක් ආයතනයක වැනි තනි කණ්ඩාමක් වශයෙන් නේවාසික පහසුකම් බලාපොරොත්තු වන පාර්ශවයන් ඉලක්ක කරගෙන ගොඩනගා ඇති මෙම නිවාස 2 ක යාබඳ නාන කාමර සහිත ත්‍රිත්ව කාමර 4 බැගින් ද මුලුතැන් ගෙයකින්ද යුක්තය.

**නිවාඩු නිකේතනය**



ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යාපනික වත්කම් වලට පරිබාහිර වූ සුවිශේෂි වත්කමකි, ආයතනය සතු නිවාඩු නිකේතනය.2014 වර්ෂයේ දී නවීකරණය කරන ලද මෙම නිවාඩු නිකේතනය තුල උණුවතුර පහසුකම සහිත යාබද නාන කාමර සහිතු ද්විත්ව කාමර 04 සහිතව පවුලේ නිවාඩුවකට ගැලපෙන කෑම කාමරය ආලින්දය හා සෙසු පහසුකම් සපයා ඇත.



නිහඬ පරිසරයක් තුල ඔබට අවශ්‍ය මූලික පහසුකම් සහිතව පූර්ණ ආරක්ෂාවක් සහිතව සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ නිවාඩු නිකේතනයේ පහසුකම් සලසා ඇත. නිවාඩු නිකේතනය වෙන්කරවා ගැනීම සෘජුව ආයතනය හරහා සිදුකර ගතහැක.

| නේවාසිකාගාර කාණ්ඩය | නේවාසිකාගාරයේ නම | කාමර සංඛ්‍යාව | පහසුකම් සැපයිය හැකි නේවාසිකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| සාමාන්‍ය ශිෂ්‍ය නේවාසිකාගාර | 1. D නේවාසිකාගාරය | 20 | 40 |
| | 2. E නේවාසිකාගාරය | 20 | 40 |
| | 3. F නේවාසිකාගාරය | 20 | 40 |
| | 4. G නේවාසිකාගාරය | 20 | 40 |
| | 5. H නේවාසිකාගාරය | 06 | 18 |
| | | **86** | **178** |
| වාණිජ නේවාසිකාගාර | 6. නව රත්නායක නේවාසිකාගාරය.(වායු සමනිත) | 22 | 26 |
| | 7. ඒ. රත්නායක නේවාසිකාගාරය.(වායු සමනිත) | 14 | 26 |
| | 8. RH නිවාස 02 | 04 | 12 |
| | 9. නිවාඩු නිකේතනය | 04 | 08 |
| | | **44** | **72** |
| | **එකතුව** | **130** | **250** |

සාමාන්‍ය ශිෂ්‍ය නේවාසිකාගාර 05 කින් ද වාණිජ නේවාසිකාගාර 04 කින් යුත් නේවාසිකාගාර පද්ධතිය නේවාසිකාගාර 9 කින් සමන්විත වන අතර, එහි 250 දෙනෙකුට එකවර නවාතැන් පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇත.

## 1.7.2.5. වෙනත් භෞතික හා ප්‍රාග්ධන සම්පත්

**තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය**



ජාතික සමුපකාර සංවර්ධන ආයතනික තොරතුරු තාක්ෂණ අංශය මධ්‍යම පලාත තුල පිහිටි රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ හොඳම පරිගණක මධ්‍යස්ථානයකි.

අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක පරිගණක ඒකකය සමුපකාර ක්ෂේත්‍රයේ විද්‍යාර්ථීන් ඉලක්ක කර පවත්වනු ලබන පාඨමාලාවන් වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රධාන පරිශ්‍රයේ පරිගණක මධ්‍යස්ථානයේ සමාලෝචිත වසරතුල පරිගණක 24 ක් වෙන්කර අධ්‍යයන අවස්ථාව ලබාදී ඇත.

පාසල් අධ්‍යාපනයේ නිරත හා පාසල් අධ්‍යාපනය අවසන් කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට ප්‍රවිශ්ඨ වීමට අපේක්ෂාවෙන් උසස් පාඨමාලාවන් සොයන දරුවන් වෙනුවෙන් වූ පාඨමාලාවන් මෙහෙයවන හා වෘත්තීය පාඨමාලාවන්ගේ තොරතුරු තාක්ෂණ විෂයයන් ආවරණය කරනු ලබන පාඨමාලාවන් පවත්වනු ලබන බහුකාර්ය ගොඩනැගිල්ලේ ස්ථාපිත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේදී සමාලෝචිත වසරේදී පරිගණක 55 ශිෂ්‍ය ප්‍රයෝජනය වෙනුවෙන් යොදා තිබිණ.

නවීන අංගෝපාංගයන් ගෙන් යුතු පරිගණක අංශය විද්‍යාගාර 4 කින් සමන්විත වන අතර එහි පරිගණක 79 ක් ජාලගත කර අන්තර් ජාල පහසුකම් ද සපයා ශිෂ්‍ය අධ්‍යාපනයට ලබා දී ඇති අතර මෙම පරිගණක අංශය අංග සම්පූර්ණ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනේ.

ආයතනික පරිගණක ඒකකයේ ඇති සුවිශේෂී තත්වයක් වන්නේ බඳවාගනු ලබන සෑම ශිෂ්‍යයෙකුටම වෙන්කල පරිගණකයක් භාවිතා කිරීමට අවස්ථාව සලසා පාඨමාලා කාලය තුල අපේක්ෂිත නිපුනතාවය ලබාගන්නේ ද යන්න පූර්ණ අධීක්ෂණයක් පවත්වා ගැනීමයි.

**පුස්තකාල පහසුකම්**



ආයතනික පුස්තකාලය මෙරට සමුපකාර ක්ෂේත්‍රය සතු දියුණුම පුස්තකාලය ලෙස සැළකේ. විවිධ විෂයන් සඳහා ලියැවුණු ජාතික හා ජාත්‍යන්තර වැදගත්කමින් යුතු පොත් හා වාර සඟරා විසි එක් දහසක් පමණ මෙහි ඇත. තවද මෙහි සමුපකාර ක්ෂේත්‍රයට සම්බන්ධ පොත් එකතුවක් වෙනම පවත්වාගෙන යනු ලබන අතර පුවත්පත් ලිපි/ සඟරා ලිපි එකතුවක් ද පවත්වාගෙන යනු ලබයි. පුස්තකාල සුචිය පරිගණක ගත කිරීම සිදු කරමින් පවතී. පුස්තකාල සේවාව සතු අන්තර්ජාල පහසුකම් ද පාඨකයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.


**මුද්‍රණාල පහසුකම්**



ඕෆ්සෙට් මුද්‍රණය හා ඩුප්ලෝ මුද්‍රණය හැකියාවෙන් යුත් ආයතනික මුද්‍රණාලය ඒ සඳහා අවශ්‍ය වන්නා වූ සෙසු යන්ත්‍ර හා පහසුකම්වලින් වලින් යුතුව ගොඩනගා ඇති අතර එමගින් ආයතනික හා විද්‍යාර්ථීන්ගේ මුද්‍රණ අවශ්‍යතාවන් සපුරාලනු ලබයි.

එසේම අනාගතයේදී රාජ්‍ය, සමුපකාර අංශයේ සහ පෞද්ගලික අංශයේ මුද්‍රණ සේවා සපයනු ලබන අංශයක් ලෙස ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

**ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම්**



සමුපකාර විෂය පිළිබඳව පවත්වන විවිධ පාඨමාලා සහ බාහිර ආයතන මගින් පවත්වන වැඩසටහන් සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් සැපයීම මෙම අංශය මගින් සිදු කෙරේ. දේශන ශාලා සඳහා ශිර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍ර, මල්ටි මීඩියා යන්ත්‍ර, ශ්‍රව්‍ය උපකරණ ආදි තාක්ෂණ ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සලසා දෙනු ලබයි. තවද "වීඩියෝකරණය" යොදා ගනිමින් කෙරෙන "මයික්‍රෝ ටීචින්" තාක්ෂණ ක්‍රමය භාවිතයට පහසුකම් මෙම අංශයෙන් ලබා ගත හැකි අතර වීඩියෝ චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ පහසුකම් ද සළසා ගත හැක. සමුපකාර ක්ෂේත්‍රයට අදාලව පැවැත්වෙන විවිධ වැඩසටහන්වල සහ උත්සවවල විශේෂ අවස්ථා ඇතුලත් ඡායාරූප ගොනු එකතුවක් පවත්වාගෙන යාමද මෙම අංශයේ තවත් සේවාවකි.

**ප්‍රවාහන සේවය**

ආයතනික අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා යොදාගනු ලබන වෙන්කල වාහන 02 ට අමතරව සංචිත වාහන ඇනිය වෑන් රථයක්, බස් රථයක් හා ත්‍රීරෝද රථයකින් සමන්විතය. ආයතනික බස් රථය විද්‍යාර්ථීන් හා බාහිර පාර්ශවයන් වෙනුවෙන් ප්‍රවාහන පහසුකම් සපයා දෙයි.

# 2. ආයතනික ප්‍රගතිය

## 2.1. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පසුගිය වසර 5 ක කාල පරිච්ඡේදය සම්බන්ධව ආදායම්, වියදම්, භාණ්ඩාගාර ප්‍රදාන සංක්ෂිප්තව පහත පරිදි වේ.

### 2.1.1. 2014 - 2018 වර්ෂික ආදායම

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික සමස්ථ ආදායම රුපියල් මිලියන **42.41** ක් වූ අතර එම ආදායම අංශ අනුව පහත පරිදි දැක්විය හැක.

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| පාඨමාලා ගාස්තු | 16,199,760 | 13,849,077 | 11,869,978 | 16,673,912 | 17,391,905 |
| නේවාසිකාගාර, දේශන ශාලා, නිල නිවාස හා ගොඩනැගිලි කුලී | 13,485,724 | 17,237,382 | 9,462,940 | 10,090,323 | 12,372,817 |
| මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරයේ ආදායම | | | 3,533,500 | 4,680,009 | 6,836,957 |
| ආහාර සැපයීම් මත කොමිස් හා සේවා ගාස්තු | 1,477,909 | 1,346,125 | 924,298 | 697,696 | 1,471,101 |
| මුද්‍රණ සේවා හා ප්‍රකාශන අලෙවි ගාස්තු | 271,715 | 34,036 | 11,737 | 109,870 | 98,829 |
| ස්ථාවර වත්කම් විකුණුම් ආදායම | 125,900 | 3,085,056 | 1,773,685 | 2,156,539 | - |
| වෙනත් ආදායම් | 2,331,964 | 573,732 | 1,913,006 | 1,776,016 | 4,246,206 |
| **මුළු ආදායම** | **33,892,972** | **36,125,408** | **29,489,144** | **36,184,365** | **42,417,815** |

### 2.1.2. 2014- 2018 වාර්ෂික වියදම

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| 1. වැටුප් හා වේතන, දේශන ගාස්තු, අනෙකුත් ගාස්තු | 26,981,094 | 29,798,644 | 32,875,799 | 32,912,050 | 33,014,927 |
| 2. ගමන් වියදම් | 1,551,703 | 808,791 | 499,670 | 347,155 | 75,175 |
| 3. සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා | 6,337,853 | 6,743,328 | 3,856,367 | 4,498,298 | 4,874,160 |
| 4. නඩත්තු වියදම් | 5,067,118 | 3,478,885 | 856,605 | 981,193 | 2,426,771 |
| 5. ගිවිසුම්ගත සේවා | 18,184,056 | 18,719,614 | 19,259,345 | 19,108,120 | 19,955,190 |
| 6. අනෙකුත් | - | 2,515,438 | 1,623,121 | 1,918,204* | 2,146,903 |
| ආ) ජාතිය ගොඩනැගීමේ බදු | 304,108 | 100,319 | 127,598 | - | - |
| ඇ) විවිධ වියදම් | 2,096,237 | - | | - | - |
| ඈ) | 1,317,366 | 1,113,596 | 305,895 | - | - |
| **මුළු වියදම** | **61,839,535** | **63,280,630** | **59,404,400** | **59,765,020** | **62,493,126** |

*** ජාතිය ගොඩනැගීමේ බදු හා ආයතනික අරමුදලට දායකත්වය ඇතුලත්ව**

## 2.1.3. 2014 - 2018 කාලය තුල භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

| විස්තරය | 2014 රු. | 2015 රු. | 2016 රු. | 2017 රු. | 2018 රු. |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 26,000,000 | 34,000,000 | 13,000,000 | 8,000,000 | 15,000,000 |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 25,425,571 | 27,054,900 | 29,217,750 | 30,978,448 | 30,527,242 |

## 2.1.4. 2014-2018 වර්ෂය තුල ආයතනික ඉපයීම්, වියදම් හා ප්‍රතිපාදන

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| 1. ආයතනික ඉපයීම් | 33,892,972 | 36,125,408 | 29,489,144 | 36,184,365 | **42,417,815** |
| 2. වියදම | 61,839,535 | 62,064,700 | 59,404,400 | 59,765,020 | **62,493,126** |
| ප්‍රතිපාදනවලට පෙර ඌනතාවය | **(27,946,563)** | **(25,939,292)** | **(29,915,256)** | **(23,580,655)** | **(20,075,311)** |
| 3.පුනරාවර්තන ප්‍රතිපාදන (භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මහජන බැංකු ආධාර) | 27,448,017 | 28,673,025 | 30,192,750 | 30,978,448 | 30,527,242 |
| ප්‍රතිපාදනවලින් පසුව (ඌනතාවය) අතිරික්තය | **(498,546)** | **2,733,733** | **277,494** | **7,397,793** | **10,451,931** |

## 2.1.5. 2014-2018 වර්ෂය තුල ලද භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් හා යෙදවීම

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | **35,165,628** | 26,025,452 | 71,365,739 | 74,558,855 | 47,782,326 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | 26,000,000 | 75,479,000 | 13,000,000 | 8,000,000 | 15,000,000 |
| සමුපකාර අරමුදලින් අත්තිකාරම් ලැබීම් | **25,000,000** | **-** | **-** | **-** | **-** |
| **මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල්** | **86,165,628** | **101,504,452** | **84,365,739** | **82,558,855** | **62,782,326** |
| **ප්‍රාග්ධන ප්‍රදාන යෙදවීම්** | | | | | |
| (ආ) ජාතික වෘත්තීය ප්‍රමිත ලබාගැනීමේ වැඩසටහන | 647,944 | 98,713 | 3,505,660 | 1,787,944 | 874,975 |
| (ඇ)ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම | 59,492,229 | 30,040,000 | - | - | - |
| (ඉ)නේවාසිකාගාර නවීකරණය | | | 6,301,224 | 32,988,585 | 13,245,915 |
| **මුළු වියදම** | **60,140,173** | **30,138,713** | **9,806,884** | **34,776,529** | **14,120,890** |
| **ඉදිරියට ගෙන ගිය ඉතිරි මුදල** | **26,025,455** | **71,365,739** | **74,558,855** | **47,782,329** | **48,661,436** |

## 2.2. අධ්‍යයන කටයුතු පිළිබඳ ප්‍රගතිය

### 2.2.1. ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය

ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථය වන සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වූ අධ්‍යාපනය හා පුහුණුව ලබාදීම අරමුණු කරගෙන ආයතනයේ අධ්‍යයන හා සංවර්ධන අංශය පහත පරිදි උප අංශ කිහිපයකින් තම අධ්‍යයන කටයුතු මෙහෙයවනු ලබයි.

I. සමුපකාර සංවර්ධන අංශය
II. මානව සම්පත් සංවර්ධන අංශය
III. පර්යේෂණ හා පුහුණු අංශය
IV. මූල්‍ය කළමනාකරණ හා සංවර්ධන අංශය
V. ව්‍යාපාර කළමනාකරණ සංවර්ධන අංශය
VI. තොරතුරු තාක්ෂණ අංශය

අධ්‍යයන හා සංවර්ධන අංශය අධ්‍යක්ෂ(අධ්‍යයන හා සංවර්ධන) යටතේ මෙහෙය වනු ලබන අතර ඉහත එක් එක් අංශ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු/කථිකාචාර්යවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. මෙම ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කථිකාචාර්ය මහත්ම මහත්මීන් 04 දෙනෙකු ද අධ්‍යයන අවශ්‍යතාවය අනුව සම්බන්ධ කරගනු ලබන තම විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් බාහිර සම්පත්දායක සංචිතයක් ද මගින් අධ්‍යයන මානව සම්පත ශක්තිමත්ව ඇත.

සමුපකාර ක්ෂේත්‍රයේ හා අධ්‍යයන පර්යේෂණ පිළිබඳ හසල දැනුමක් සහිත කණ්ඩායමකගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන පුහුණු අවශ්‍යතා හඳුනාගැනීමේ වැඩසටහනක් මගින් තීරණය කරනු ලබන අන්තර්ගතයන් ඇතුලත්කර ආයතනික වාර්ෂික පුහුණු මාර්ගෝපදේශය ගෙඩනගනු ලැබේ. ඒ ඔස්සේ ආයතනික අධ්‍යයන මණ්ඩලයේ ද ආයතනයේ කථිකාචාර්ය මණ්ඩලයේ හා බාහිර සම්පත්දායකයින්ගේ සේවය ලබා ගනිමින් සෑම පාඨමාලාවකම ගුණාත්මකභාවය වර්ධනය කර පවත්වා ලනු ලැබේ.

ආයතනික පනතේ පළමු කොටසේ 4 වගන්තියේ උප වගන්ති (අ) සිට (ඒ) දක්වා වූ කර්තව්‍යයන් මගින් ඉලක්කගත කර ප්‍රමුඛතම කාර්යභාරය වනුයේ සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සංවර්ධනය කිරීමයි.

මෙම අරමුණ මුල් කොටගෙන සමාලෝචිත වසර තුල සමුපකාර අංශයට ප්‍රමුඛතාවය දෙමින් ශ්‍රී ලාංකේය මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා හා විෂයානු බද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් **69** ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් අතරින් 04 ක් 2017 වසරතුල ආරම්භවූ අතර සෙසු වැඩසටහන් **65, 2018** වසර තුල ආරම්භව ක්‍රියාත්මක වූ ඒවා වේ.

## ආයතනය මඟින් සංවිධානය කළ පාඨමාලා පිළිබඳ ප්‍රගතිය 2014 - 2018

| පාඨමාලා | | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගීත්වය |
| නිත්‍ය පුහුණු පාඨමාලා | සමුපකාර සංවර්ධන සහතික පත්‍ර | 08 | 164 | 07 | 159 | 07 | 163 | 02 | 85 | 01 | 24 |
| | සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා | | | | | | | 01 | 42 | 01 | 44 |
| සෙසු ඩිප්ලෝමා පාඨමාලා | සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා | | | | | | | 06 | 105 | 05 | 80 |
| | තොරතුරු තාක්ෂණ | | | | | | | 01 | 13 | 01 | 17 |
| | සමුපකාරික නොවන වෘත්තීමය | | | | | | | 01 | 26 | 01 | 28 |
| සෙසු සහතික පත්‍ර පාඨමාලා | සමුපකාරික වෘත්තීමය සහතිකපත් | 11 | 199 | 12 | 218 | 11 | 240 | 01 | 34 | 00 | 00 |
| | තොරතුරු තාක්ෂණ | | | | | | | 06 | 66 | 04 | 45 |
| | භාෂා | | | | | | | 02 | 24 | 02 | 06 |
| කෙටිකාලීන වැඩසටහන් | පුහුණු මාර්ගෝපදේශයේ ඇතුලත් | 51 | 1879 | 19 | 666 | 22 | 711 | 19 | 547 | 18 | 520 |
| | පුහුණු මාර්ගෝපදේශයේ ඇතුලත් නොවූ | | | | | | | 04 | 169 | 07 | 294 |
| මහජන බැංකු ආධාර මත පුහුණු වැඩසටහන් | | 10 | 360 | 40 | 1548 | 04 | 237 | 6 | 230 | 00 | 00 |
| ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් | | | | | | | | 3 | 76 | 01 | 23 |
| වෘත්තීය විභාග සඳහා සිසුන් පුහුණු කිරීම | | 06 | 301 | 10 | 157 | 07 | 96 | 7 | 162 | 10 | 276 |
| මුළු අධ්‍යයන පාඨමාලා සංඛ්‍යාව | | 86 | 2903 | 88 | 2748 | 51 | 1447 | 59 | 1579 | 51 | 1357 |
| ආයතනික සම්පත් උපයෝගී කරගෙන බාහිර ආයතන පැවැත්වූ පුහුණු වැඩසටහන් | | 380 | 23475 | 712 | 36965 | 321 | 16955 | 979 | 22376 | 317 | 26265 |
| **එකතුව *** | | **466** | **26378** | **800** | **39713** | **372** | **18402** | **1038** | **24,955** | **419** | **28979** |

### 2.2.2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි පුහුණුව

ආයතනයේ මුඛ්‍ය කර්තව්‍යය වන්නේ සමුපකාර ක්ෂේත්‍රය යාවත්කාලීන වූ දැනුමින් පෝෂණය කොට සමුපකාර ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායකත්වය දැක්වීමයි. ඒ අනුව සමුපකාර ක්ෂේත්‍රය වෙනුවෙන් වූ අනිවාර්ය පාඨමාලාවන් නිත්‍ය පුහුණු පාඨමාලා ගණයේ ලා සැලකේ.

ඒ අනුව මධ්‍යම රජයේ හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ වෘත්තීමය අවශ්‍යතා වෙනුවෙන් සැලැසුම්කර ඇති සමුපකාර සංවර්ධන සහතික

පත්‍රපාඨමාලාව හා සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව ආයතනයේ නිත්‍ය පාඨමාලාවන්ය.

#### 2.2.2.1. සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත බඳවාගනු ලබන සෑම නවක සමුපකාර සංවර්ධන නිළධාරියකු විසින්ම මෙම පාඨමාලාව සමත්විය යුතුය. පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම හා සේවය ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලෙස නිර්දේශිත පාඨමාලාව මෙයයි.

2017 වසර තුළ සබරගමුව පළාත් සහ දකුණ,බස්නාහිර හා ඌව පළාත් සඳහා ඒකාබද්ධව සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා ආරම්භකල සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාවේ දෙවන වාරයේ අධ්‍යයන කටයුතු අවසන් කිරීම සහ මධ්‍යම රජය හා දකුණු පළාත් ඒකාබද්ධව සමුපකාර සංවර්ධන සහතිකකපත්‍ර පාඨමාලාව 2018.11.15 දින ආරම්භ කරන ලදී.

| පාඨමාලාව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සබරගමුව පළාත) | 2017.10.02 | 2018.12.28 | 32 |
| 2. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දකුණ,බස්නාහිර හා ඌව පළාත්) | 2017.12.04 | 2018.04.10 | 53 |
| 3. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මධ්‍යම රජය හා දකුණු පළාත) | 2018.11.15 | 2019.04.01 | 24 |
| **එකතුව** | | | **109** |

මෙම ආයතනය මගින් පසුගිය පස් වසරතුල පවත්වන ලද සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වු මුළු සංඛ්‍යාව* |
| 2014 | 01 | 52 |
| 2015 | 01 | 34 |
| 2016 | 02 | 120 |
| 2017 | 02 | 85 |
| 2018 | 01 | 24 |

* ඒ ඒ වර්ෂය තුල නව ලියාපදිංචි පාඨමාලා හා ශිෂ්‍ය සංඛ්‍යා පමණක් දැක්වේ.

**2.2.2.2. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව**

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත බඳවා ගනු ලැබූ සේවයේ ස්ථිර කරන ලද, සේවා කාළය වසර පහක් සම්පූර්ණ වූ සමුපකාර සංවර්ධන නිලධාරින්ගේ දෙවන කඩඉම් පරීක්ෂණය ලෙස නිර්දේශිත පාඨමාලාව සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාවයි.

2018 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් වයඹ හා නැගෙනහිර පළාත් ඒකාබද්ධව එක් පාඨමාලාවක් නිළධාරීන් 44 දෙනෙකු වෙනුවෙන් ආරම්භ කරන ලදී.

| පාඨමාලාව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (වයඹ හා නැගෙනහිර පළාත) | 2018.04.02 | 2018.10.12 | 44 |

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා පසුගිය පස් වසරක කාලය තුල පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබද සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ. මෙම පාඨමාලාවන් සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව මධ්‍යම රජයේ හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වෙත කරනු ලබන බදවා ගැනීම් මත රදා පවතී.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වූ මුළු සංඛ්‍යාව* |
|---|---|---|
| 2014 | 01 | 29 |
| 2015 | 01 | 40 |
| 2016 | නව ලියාපදිංචි නැත | |
| 2017 | 01 | 42 |
| 2018 | 01 | 44 |
| **මුළු සංඛ්‍යාව** | **04** | **155** |

***ඒ ඒ වර්ෂය තුල නව ලියාපදිංචි පාඨමාලා හා ශිෂ්‍ය සංඛ්‍යා පමණක් දැක්වේ.**

**2.2.3. ඩිප්ලෝමා පාඨමාලා**

ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රය ප්‍රමුඛ කරගනිමින් හඳුනාගත් වෙනත් ක්ෂේත්‍ර වෙත ද අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පුළුල් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව වර්තමානයේ දී පහත ක්ෂේත්‍ර ආවරණය කෙරෙන සේ ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි.

- සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා
- තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා
- සමුපකාරික නොවන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා

### 2.2.3.1. සමුපකාරික වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා


මෙම පාඨමාලා සමුපකාර ව්‍යාපාරයේ වෘත්තිකයන් එනම් සමුපකාර සමිති කාර්ය මණ්ඩලය හා සභාපතිවරු ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම සේවකයන්ගේ දැනුම හා කුසලතාවය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම්කර ඒ ඒ ක්ෂේත්‍රය ඔස්සේ පවත්වනු ලබන එක් අවුරුදු අර්ධ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවන් වේ.

2018 වසර තුල ඩිප්ලෝමා පාඨමාලා 05 ක් ආරම්භ කරන ලද අතර එමගින් සිසුන් 80 දෙනෙක් වෙනුවෙන් අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දෙන ලදී.

2018 වර්ෂයේදී ආරම්භ කරන ලද ඩිප්ලෝමා පාඨමාලාවල විස්තර පහත පරිදි වේ.

| පුහුණු පාඨමාලාව | ආරම්භක දිනය | අවසන් කිරීමට නියමිත දිනය | සහභාගි වු සංඛ්‍යාව |
|---|---|---|---|
| බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 2018.03.26 | 2019.03.26 | **22** |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 2018.03.26 | 2019.03.26 | **08** |
| විගණන ඩිප්ලෝමා පාඨමාලාව | 2018.05.08 | 2019.05.08 | **21** |
| ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2018.05.08 | 2019.05.08 | **13** |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2018.03.26 | 2019.03.26 | **16** |
| **එකතුව** | | | **80** |

2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලය තුල මෙම ආයතනය මගින් පවත්වන ලද සමුපකාර වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.



| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වු මුළු සංඛ්‍යාව* |
|---|---|---|
| 2014 | 6 | 110 |
| 2015 | 6 | 106 |
| 2016 | 5 | 101 |
| 2017 | 6 | 105 |
| 2018 | 5 | 80 |
| **මුළු සංඛ්‍යාව** | | **502** |

### 2.2.3.2. තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව

මෙම පාඨමාලාව පාසැල් අධ්‍යාපනය අවසන් කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙන් උසස් අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන තරුණ තරුණියන් වෙනුවෙන් නුතන පරිගණක භාෂා තුනක් ද ඇතුලත්කර සැලසුම් කරන ලද සය මාසික පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවකි.



සෑම වසරකම අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උ.පෙ) අවසන් වූ පසු ආරම්භ කෙරෙන මෙම පාඨමාලාවට 2018 වසරේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 17 දෙනෙකු ඇතුලත් කරගන්නා ලදී.

| පාඨමාලාවේ නම | ආරම්භක දිනය | අවසන්කළ/අවසන් කිරීමට නියමිත දිනය | පුහුණුලාභී න් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | 2018.09.25 | 2019.03.25 | 17 |

2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලය තුල මෙම ආයතනය මගින් පවත්වන ලද තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වු ශිෂ්‍ය සංඛ්‍යාව* |
|---|---|---|
| 2014 | 02 | 58 |
| 2015 | 01 | 28 |
| 2016 | 01 | 26 |
| 2017 | 01 | 13 |
| 2018 | 01 | 17 |
| **මුළු සංඛ්‍යාව** | **6** | **142** |

#### 2.2.3.3. සමුපකාරික නොවන වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා

පාසැල් අධ්‍යාපනය අවසන් කර ව්‍යාපාරික ක්ෂේත්‍රයට අවතීර්ණවීමේ අපේකෂාවෙන් උසස් අධ්‍යාපනය යොමුවන තරුණ පරම්රාව වෙනුවෙන් සැලසුම් කරන ලද ව්‍යාපාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සය මාසික අර්ධ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවකි. ශ්‍රී ලංකා ශිල්පීය ගණකාධිකරණ ආයතනයේ ව්‍යාපාර සංවර්ධන උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශ පාඨමාලාවක් ලෙස ගිවිසුම් ගතව ඇති මෙම පාඨමාලාව 2017 වසරතුල හඳුන්වාදෙන ලද පාඨමාලාවකි.

ආරම්භක කණ්ඩායම ශිෂ්‍ය ශිෂ්‍යාවන් 26 දෙනෙකුගෙන් සමන්විතව වූ අතර 2018 වසරේ නව ලියාපදිංචිය 28 දෙනෙකි.

| පාඨමාලාවේ නම | ආරම්භක දිනය | අවසන් කළ/අවසන් කිරීමට නියමිත දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමා | 2018 .07 | 2019.07 | 28 |

### 2.2.4. සහතික පත්‍ර පාඨමාලා

වාර්ෂික පුහුණු මාරගෝපදේශය තුල ඇතුලත් හා ඉන් බැහැරව අදාල කාලසීමාවතුලදී හදුනාගනු ලබන සහතික පත්‍ර පාඨමාලා සැලසුම්කර පැවත්වීමට ආයතනය කටයුතු කරනු ලබන අතර 2018 වසර තුලදී පහත ක්ෂේත්‍රගත පාඨමාලාවන් පවත්වා ඇත

- සමුපකාරික වෘත්තීමය සහතිකපත්‍ර පාඨමාලා
- තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලා
- භාෂා සහතිකපත්‍ර පාඨමාලා

#### 2.2.4.1. සමුපකාරික වෘත්තීමය සහතික පත්‍ර පාඨමාලා

සමුපකාර ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සෘජුව ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා ලියාපදිංචිවීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති වෘත්තිකයන් සඳහා මෙම පාඨමාලාවන් සැලසුම් කෙරේ. එමෙන්ම විවිධ සමුපකාරික ආයතන වෙතින් ඉදිරිපත් කෙරෙන කාලීන අවශ්‍යතාවන් අනුව ද සහතිකපත්‍ර පාඨමාලා සංවර්ධනය කිරීම කරනු ලබයි.

සමාලෝචිත 2018 වසරතුල නව පාඨමාලා ආරම්භකර නැත.

#### 2.2.4.2. තොරතුරු තාක්ෂණ සහතිකපත්‍ර පාඨමාලා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය අවසන්කර උසස් පෙළ ප්‍රවේශය අපේක්ෂාවෙන් සිටින පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා මූලික තොරතුරු තාක්ෂණික දැනුම අපේක්ෂා කරනු ලබන වැඩිහිටි කාණ්ඩය ඉලක්ක ගත කර ඇති NVQ Level- 03 සහතික පත්‍රපාඨමාලාව හා වයස අවුරුදු 05 සිට ඉහළට දරුවන් වෙනුවෙන් සැලසුම්කර ඇති ඉ-කිඩ්ස් පාඨමාලාවන් මේ අතරින් ප්‍රමුඛ වේ.

| | පාඨමාලාවේ නම | සහභාගීත්වය |
|---|---|---|
| 1. | Certificate in Computer Application Assistant (NVQ Level 03) | 10 |
| 2. | E- kids Computer Learning - (PL & IL) | 35 |
| 3. | E- kids Computer Learning –IV | |
| 4. | Computer Learning O/L ICT | |
| 5. | Computer hardware Engineering | - |
| 6. | Web Base Trainnig Programme | 10 |
| 7. | Other IT workshop | 223 |
| | **එකතුව** | **278** |

2018 වර්ෂය තුළ දී පරිගණක සහතිකපත්‍ර පාඨමාලා 05 ක් ආරම්භ කර පුහුණුලාභීන් 55 දෙනෙකු වෙනුවෙන් ද වෙනත් වැඩසටහන් 12 සාර්ථකව පවත්වා 223 වෙනුවෙන් ද වශයෙන් 278 පුහුණුව අවසන් කර ඇති අතර 2014-2018 කාලය තුල තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ප්‍රගතිය පහත පරිදිය.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව* | සහභාගි වු ශිෂ්‍ය සංඛ්‍යාව* |
|---|---|---|
| 2014 | 06 | 106 |
| 2015 | 05 | 107 |
| 2016 | 06 | 136 |
| 2017 | 06 | 66 |
| 2018 | 04 | 45 |
| **මුළු සංඛ්‍යාව** | **27** | **460** |

### 2.2.5. භාෂා සහතිකපත්‍ර පාඨමාලා

විවිධ රැකියා නියුක්තිකයන් පාසැල් හැරගිය තරුණ තරුණියන් හා උක්ත භාෂාවන් වැඩි දියුණු කර ගැනීමේ අරමුණෙන් පසු වන්නන් සඳහා සැලසුම්කල ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලා දෙකක් 2018 වසරේ දී පවත්වා ඇත. ඒ සදහා සිසුන් 13 දෙනෙකු සහභාගී වී ඇත.

| පාඨමාලාවේ නම | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 1. ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව - 01 | 06 |
| **එකතුව** | **06** |

### 2.2.6. විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන්

වාර්ෂිකව මෙම ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සමුපකාර සමිති නායකයින්, සේවකයින් හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවලට අනුයුක්ත නිලධාරීන් මෙන්ම රාජ්‍ය අංශයේ සේවකයින් ඉලක්ක කරගෙන ඉලක්කගත ක්ෂේත්‍රයන්ට අදාලව කෙටිකාලීන කළමනාකරණ හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.

මෙම වැඩසටහන් පූර්වයෙන් හඳුනාගත් ක්ෂේත්‍රයන් වෙනුවෙන් මෙන්ම අදාල අධ්‍යයන වර්ෂය තුලදී ඒ ඒ ආයතන විසින් ඉල්ලුම් කරන ක්ෂේත්‍රයන් වෙනුවෙන් ද පාඨමාලා සැලැසුම් කෙරේ.

### 2.2.7. පුහුණු මාර්ගෝපදේශය අනුව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන්

පුහුණු මාර්ගෝපදේශයට ඇතුලත්කල කෙටිකාළීණ පාඨමාලා 20 ක් මෙම වර්ෂයතුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර එමගින් පුහුණුලාභීන් 600 දෙනෙකු සඳහා පුහුණුව ලබාදීමට අපේක්ෂා කරන ලද ද වසර අවසාන වනවිට පුහුණු පාඨමාලා 18ක් පවත්වා පුහුණු ලාභීන් 520 දෙනෙකු පුහුණු කරවා ඇත.

| | පාඨමාලාවේ නම | අපේක්ෂිත පුහුණු ලාභීන් ගණන | තත්‍ය සහභාගීත්වය |
|---|---|---|---|
| 1. | පර්යේෂණ නිබන්ධනයක් පිළියෙළ කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 22 |
| 2. | ලේකම් පරිචය පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 14 |
| 3. | කළමනාකරණ විගණන පුහුණු වැඩසටහන 1 | 30 | 17 |
| 4. | ආයතනික අභිවෘද්ධිය උදෙසා අලෙවිකරණය හා පාරිභෝගික සත්කාරය | 30 | 22 |
| 5. | අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු වැඩසටහන (NESCO) 1 | 30 | 20 |
| 6. | අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු වැඩසටහන (NESCO) 2 | 30 | 21 |
| 7. | බදු කරණය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන | 30 | 28 |
| 8. | අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු වැඩසටහන (NESCO) 3 | 30 | 16 |
| 9. | කළමනාකරණ විගණන පුහුණු වැඩසටහන 2 | 30 | 21 |
| 10. | ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණන පුහුණු වැඩසටහන | 30 | 36 |
| 11. | තීරකකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 33 |
| 12. | F 28 වාර්තා සමාලෝචන පුහුණු වැඩසටහන | 30 | 29 |
| 13. | විගනණ ප්‍රමිත භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 30 |
| 14. | බැංකු නියාමනය හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 16 |

| | | | |
|---|---|---|---|
| 15. | මහජන සම්බන්ධතා කළමනාකරණය හා විධිමත් කාර්යාල කළමනාකරණ ක්‍රම හඳුන්වාදීමේ පුහුණු වැඩමුලුව | 30 | 28 |
| 16. | ග්‍රාමීය බැංකු ණය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 43 |
| 17. | සමුපකාර සමිතිවල විධායක නිළධාරීන්ගේ කුසලතා වර්ධන පුහුණු වැඩසටහන | 30 | 08 |
| 18. | සමුපකාර සමිතිවල සේවා මණ්ඩල කාර්යන්ට අදාල නෛතික විධිවිධාන දැනුවත් කිරීමේ වැඩමුලුව | 30 | 59 |
| 19. | උසාවි රාජකාරී කටයුතුවල නිරත සමු.සං නිළධාරීන්ගේ කාර්යාභිවර්ධන පුහුණු වැඩසටහන | 30 | 30 |
| 20. | අධ්‍යක්ෂ මණ්ඩල පුහුණු වැඩසටහන 4 (දෙමළ මාධ්‍ය) | 30 | 27 |
| | **එකතුව** | **600** | **520** |

### 2.2.8. පුහුණු මාර්ගෝපදේශයෙන් බැහැරව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන්

2018 වර්ෂයේ දී සැලසුම්ගත කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම අපේක්ෂිත ඉලක්කය වූ වැඩසටහන් 20 න් 18 ක් පැවත්වීමට සමත් වූ අතර, වාර්ෂික පුහුණු මාර්ගෝපදේශයට ඇතුලත් නොවූ වැඩසටහන් 07 ක් සැලසුම්කර පවත්වන ලද අතර එමගින් පුහුණුලාභීන් 294 දෙනෙකු වෙත පුහුණුව ලබා දී ඇත.

| | පාඨමාලාව නම | පැවැත් වූ දින | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| 1. | සී/ස කටාන විවිධ සේවා සමුපකාර සමිතිය මහ සභා නියෝජිත පුහුණුව | 2018.03.17 | 40 |
| 2. | මහවැලි ගොවි සංවිධාන විගණන පුහුණු වැඩසටහන I | 2018.03.30 2018.04.03 | 45 |
| 3. | මහවැලි ගොවි සංවිධාන විගණන පුහුණු වැඩසටහන 2 | 2018.05.26 2018.05.30 | 36 |
| 4. | සී/ස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතිය කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන | 2018.09.23 - 24 | 37 |
| 5. | සී/ස බෙරළපනාතර විවිධ සේවා සමුපකාර සමිති නිළධාරීන් සඳහා සේවක ආකල්ප සංවර්ධන වැඩසටහන | 2018.12.26 - 27 | 48 |
| 6. | සමුපකාර කලමණාකරණය හා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව-මන්නාරම දිස්ත්‍රික්කය | 2017.06.02 - 2018.04. | 34 |
| 7. | සී/ස කුලියාපිටිය ස.ණ.ස. සමිති සංගමය බැංකු කළමණාකරණ ඩිප්ලෝමා | 2018.08.05 2019.09.15 | 54 |
| | **එකතුව** | | **294** |

සමස්ථයක් වශයෙන් 2018 වර්ෂය තුල කෙටිකාලීන පුහුණු වැඩසටහන් 38 ක් පවත්වා පුහුණුලාභීන් 753 දෙනෙකු වෙනුවෙන් පුහුණුව ලබා දී ඇත.

2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුලදී මෙම ආයතනය මගින් පවත්වන ලද විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් සදහා පුහුණුලාභීන් සංඛ්‍යාව පිලිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වු මුළු සංඛ්‍යාව |
| 2014 | 51 | 1,879 |
| 2015 | 19 | 666 |
| 2016 | 22 | 711 |
| 2017 | 19 | 547 |
| 2018 | 27 | 814 |
| **එකතුව** | **138** | **4,617** |

### 2.2.9. අන්තර්ජාතික පුහුණු වැඩසටහන්

ආයතනික පනතේ 4(ඒ) උප වගන්තිය ප්‍රකාරව ආයතනික කර්තව්‍යයට සමාන කර්තව්‍යය ඉටුකරන ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ. ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සංවිධාන හා සම්බන්ධතා පැවැත්වීම තුලින් ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරය වෙත හා මෙම ආයතනයේ ඉදිරි ප්‍රගමනය උදෙසා ඉතා වැදගත් කාර්යයකි.

ආයතනය අන්තර් ජාතික සමුපකාර සන්ධානයේ (International Co-operative Alliance) හා ඉන්දියාවේ පූනේ නුවර පිහිටි වෛකුන්ත්මේතා ජාතික සමුපකාර කළමනාකරණ ආයතනයේ, අන්තර්ජාතික සමුපකාරය හා කෘෂිකාර්මික බැංකුකරණ මධ්‍යස්ථානය (Center for International Co-operation and Training in Agricultural Banking - (CICTAB) යන ආයතනයන් හි සාමාජිකත්වය ලබා ඇත.

වෛකුන්ත්මේතා ජාතික සමුපකාර කළමනාකරණ ආයතනය සමඟ ඇති කරගෙන ඇති අවබෝධතා ගිවිසුම ඔස්සේ සමුපකාරික වෘත්තිකයන් හුවමාරු කරගැනීම හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් පවත්වනු ලබන අතර 2018 වසරේ දී වැඩසටහන් 01 ක් පවත්වා ඉන්දිය හා දකුණු ආසියානු සමුපකාර වෘතිකයින් 23 දෙනෙකු සදහා දේශීය සමුපකාරික අත්දැකීම් හා දැනුම ලබාදෙන ලද අතර 2017 වසරතුල එම සංඛ්‍යාව 76 දෙනෙකු විය.

පසුගිය වසර 04 ක කාලය තුල මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත සාරාංශය මගින් දැක්වේ.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වු මුළු සංඛ්‍යාව |
| 2015 | 05 | 109 |
| 2016 | 03 | 60 |
| 2017 | 03 | 76 |
| 2018 | 01 | 23 |
| **එකතුව** | **11** | **268** |

### 2.2.10. වෘත්තීය පාඨමාලා සඳහා සිසුන් සූදානම් කිරීම

රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් හා රජයේ සේවකයන් සඳහා පරිගණක දැනුම, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රිසි දැනුම හා ගණකාධිකරණ හා කළමනාකරණ දැනුම ලබාදීම අරමුණු කරගෙන මෙම ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා මෙන්ම වෘත්තීය විභාග සඳහා සිසුන් පුහුණුකිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (Sri Lanka Institute of Charterd Accountancy) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනය (AAT), මගින් පවත්වනු ලබන විභාග සඳහා ගුණාත්මක දැනුමක් සහිත සිසුන් සූදානම් කිරීමේ අරමුණු සහ ආයතනික සමාජ මෙහෙවර පෙරදැරිව වෘත්තීය පාඨමාලා ආරම්භ කරන ලදි.

| පාඨමාලාවේ නම | කාලසීමාව | පුහුණුලාභීන් සංඛ්‍යාව* |
|---|---|---|
| CA Business Level -2018 June | 2018 Jan to 2018 June | 50 |
| CA Business Level -2018 December | 2018 July to December | 48 |
| CA Executive Level -2018 September | 2018 March to 2018 Sep | 46 |
| CA Executive Level -2019 March | 2018 Sep to 2019 March | 40 |
| AAT (AA1) Sinhala - 2018 July | 2018 Jan to July | 11 |
| AAT (AA2) Sinhala -2018 December | 2018 August to December | 7 |
| AAT (AA3) Sinhala - 2018 June | 2018 Feb to 2018 June | 13 |
| CA English Course - 2018 September | 2018 May to Sep | 26 |
| CA English Course - 2019 February | 2018 Oct to 2019 Feb | 25 |
| Computerize accounting & Auditing | 2018 July to 2018 September | 10 |
| **එකතුව** | | **276** |

***2018 වසරේ නව ලියාපදිංචි කිරීම් පමණි**

2018 වර්ෂයේ දී පාඨමාලා 10 ක අධ්‍යයන කටයුතු ආරම්භ කර එමගින් සිසුන් 276 දෙනෙක් එම ආයතනවල විභාග සඳහා සූදානම් කරන ලද අතර 2017 වර්ෂයේ දී පාඨමාලා 07 ක අධ්‍යයන කටයුතු ආරම්භ කර එමගින් සිසුන් 162 දෙනෙක් එම ආයතනවල විභාග සඳහා සූදානම් කරඇත.

### 2.2.11. 2018 වසරතුල ආයතනික සම්පත් උපයෝගී කරගෙන බාහිර ආයතන පැවැත්වූ පුහුණු වැඩසටහන්

ආයතනික කාර්යභාරය විවිධාංගීකරණය කිරීම හා දේපල පූර්ණ ධාරිතාවයෙන් සේවානියුක්ත කොට ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් රාජ්‍ය,අර්ධ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ හා රාජ්‍ය නොවන සංවිධාන සඳහා ද ආයතනික පහසුකම් උපයෝගිකර අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට අවස්ථාව සලසා ඇත.

ඒ අනුව 2018 වසරේදී ආයතනය විසින් එවැනි වැඩසටහන් 317 ක් පවත්වා පුහුණුලාභීන් 26,265 දෙනෙකු සඳහා දැනුම ලබාදීමට පහසුකම් සලසා ඇත. එය 2017 වර්ෂයට සාපේක්ෂව වැඩසටහන් සංඛ්‍යාවේ 80% හා පුහුණු ලාභීන් සංඛ්‍යාවේ 85% ඉහළ යාමකි.

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 380 | 712 | 321 | 255 | 317 |
| සහභාගි වූ මුළු සංඛ්‍යාව | 23,475 | 36,965 | 16,955 | 22,376 | 26265 |

සමාලෝචිත 2018 වසරතුල සමස්ථයක් වශයෙන් ආයතනය විසින් සැලසුම්කර සංවිධානය කරන ලද දෙස් විදෙස් පාඨමාලා හා වැඩසටහන් 65 මගින් විද්‍යාර්ථීන් 1357 ක් වෙනුවෙන් දැනුම හා පුහුණුව ලබා දී ඇති අතර බාහිර ආයතන වෙතින් සංවිධානය කරන ලද වැඩසටහන් 317 මගින් පුහුණු ලාභීන් 26,265 ක් ද වශයෙන් වැඩසටහන් 382 මගින් පුහුණුලාභීන් 27,622 වෙනුවෙන් අධ්‍යයන හා පුහුණු පහසුකම් සැලසීමට ආයතනය සමත්ව ඇත.

## 2.3. ආයතනයේ අධ්‍යයන පහසුකාරක සේවා ප්‍රගතිය

ආයතනයේ අධ්‍යයන කටයුතු සාර්ථක කරගැනීම වෙනුවෙන් සැකසුනු සහය සේවා රැසකින් මෙම ආයතනය පොහොසත්ය.

### 2.3.1. නේවාසික අංශය

ආයතනයේ පුහුණුව සඳහා පැමිණෙන පුහුණුවන්නන්ගේ නවාතැන් අවශ්‍යතා අනුව සියලු නේවාසිකයින් සඳහා ඉගෙන ගැනීමට සුදුසු පරිසරයක් හා ආරක්ෂා සහිතව නැවතීමේ පහසුකම් සැපයීම නේවාසික අංශයේ ප්‍රධාන කාර්ය වේ. ආයතනික නේවාසික අංශයේ නේවාසිකාගාර පිළිබඳ සවිස්තර වාර්තාවක් පහත දක්වා ඇත.

(රු .000)

| විස්තරය | නවාතැන් පහසුකම් | ශාලා පහසුකම් | ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් | ආහාර පාන සඳහා කොමිස් මුදල් | වතුර බෝතල් සඳහා අයකිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2018 | 8.340 | 3.21 | 0.735 | 1.366 | 0.32 | 13.97 |

නේවාසික අංශය මගින් පාලනය වන භෝජනාගාරය මඟින් නේවාසිකයින්ට , බාහිර හා අභ්‍යන්තර පුහුණුලාභීන්ගේ ඉල්ලීම් අනුව අවශ්‍ය වන ආකාරයට ආහාර පාන සැපයීම සිදු කරනු ලබන අතර දිනකට ආයතනයේ පුහුණුවීම් කටයුතුවල නියැලෙන 100 ත් 300 ත් අතර පුහුණුලාභීන් ප්‍රමාණයකට ආහාර සැපයීමට පහසුකම් සහිත භෝජනාගාරයක් ද මීට අයත්ය.

### 2.3.2. පුස්තකාල අංශය

ආයතනයේ අධ්‍යයන අංශය යටතේ ස්ථාපිත කර ඇති පුස්තකාලය විශේෂ පුස්තකාල යටතේ වර්ග කර ඇත. ආයතනයේ පාඨමාලා හදාරන පුහුණුලාභීන් හා ආයතනයේ කාර්ය මණ්ඩලය මෙහි නිත්‍ය පාඨකයින් වන්නේය.

වාර්ෂිකව ආයතනික අධ්‍යයන අවශ්‍යතා අනුව පුස්තකාලය සඳහා නව ප්‍රකාශන එකතු කිරීම සිදුකෙරේ. ඒ යටතේ 2018 වසර ඇතුලත පුස්තකාලයට නව ග්‍රන්ථ 100 ක් මිලදී ගෙන ඇති අතර පරිත්‍යාග වශයෙන් පොත් 10 විශ්‍රාමලත් කථිකාචාර්ය වරුන් දෙදෙනෙකු වෙතින් ලැබී ඇත. පොත් මිලදී ගැනීමේදී ප්‍රධාන විෂය ධාරාව වන සමුපකාර විෂය මෙන්ම සෙසු පාඨමාලා සඳහා අවශ්‍ය අනෙකුත් අනු විෂයන් වන කළමනාකරණය,ගණකාධිකරණය, විගණනය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, බැංකු ආදී වශයෙන් විෂයන් ගණනාවක් කෙරෙහිද අවධානය යොමු කෙරේ. මේ වන විට පුස්තකාලය සතු මුළු පොත් සංඛ්‍යාව 22,053කි.

පුස්තකාලය සතුව සමුපකාර ක්ෂේත්‍රයට අදාල දුර්ලභ ගණයේ පොත් පත් රාශියක් හා 1911 සිට සමුපකාර ව්‍යාපාරය සඳහා නිකුත් කළ පනත් හා වාර්තාවල එකතුවක්ද ඇත.

දිනපතා හා සතිපතා පුවත්පත්වල පලවන සමුපකාර ක්ෂේත්‍රයට මෙන්ම පුහුණුලාභීන්ට වැදගත් වන තෝරාගත් ලිපි එක්රැස් කර විවිධ විෂයන් සඳහා වෙන් වෙන්ව පුවත්පත් අනුක්‍රමණිකා සාදා ඇත. එසේම 2009 වසරේ සිට සමුපදීපණී අතිරේක සියල්ලම පුස්තකාලය සතුව ඇත. පොත්පත්වලට අමතරව වාර සඟරා එකතුවක් මෙන්ම අමතර තොරතුරු ගවේෂණය සඳහා අන්තර්ජාල පහසුකම් ද ඇත.

### 2.3.3. විභාග අංශය

ලේඛකාධිකාරීගේ පූර්ණ අධීක්ෂණයට යටත් විභාග අංශය ආයතනය මඟින් පවත්වනු ලබන නිත්‍ය පුහුණු පාඨමාලා, වෘත්තිමය ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා ඇතුලත් සෑම පාඨමාලාවක් සඳහාම විධිමත් විභාග පටිපාටියක් යටතේ සියලු විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීම කරනු ලබන්නේ විභාග අංශය මඟිනි.

ආයතනික පාඨමාලා ස්වරූපය අනුව සෑම මසකදීම වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා වෙනුවෙන් ද, නිත්‍ය පුහුණු පාඨමාලාවන් වෙනුවෙන් සෑම වාරයක්/ පාඨමාලාව අවසානයේ දී විභාග පැවැත්වීම කෙරේ.

මෙම නිත්‍ය කාර්යයට අමතරව ආයතනය වෙත කෙරෙන බාහිර ඉල්ලීම් අනුව සමුපකාර සමිති වෙනුවෙන් විවිධ කරුණු සඳහා ආයතනික අධ්‍යයන හා සංවර්ධන අංශය සමඟ එක්ව විභාග සංවිධානය කර පැවැත්වීම ද සිදුකෙරේ.

විභාග අංශය විසින් සමාලෝචිත වසර තුලදී අධ්‍යයන මණ්ඩල රැස්වීම් 02 කදී විභාග ප්‍රතිඵල අනුමත කරගෙන ඇත.

| දිනය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | පෙනීසිටි | සමත් | ඌන සමත් | අසමත් |
| 2018.01.24 | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව (වයඹ) - 2016/2017 | 62 | 58 | 04 | - |
| | ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 | 24 | 19 | 03 | 02 |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 | 34 | 14 | 14 | 06 |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 | 06 | 03 | 03 | - |
| | විගණන ඩිප්ලෝමා පාඨමාලාව - 2016 | 19 | 12 | 05 | 02 |
| | ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 | 17 | 09 | 08 | - |
| | තොරතුරු තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව 2016/17 | 18 | 12 | 04 | 02 |
| | සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (සබරගමුව පළාත) - 2015/16 (පුනර් පරීක්ෂණය) | 06 | 06 | - | - |
| | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව (ඌව පළාත)-2015/2016 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |
| | විගණන ඩිප්ලෝමා පාඨමාලාව - 2015 (පුනර් පරීක්ෂණය) | 02 | 02 | - | - |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2015 (පුනර් පරීක්ෂණය) | 03 | 03 | - | - |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව- 2015 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |
| | ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2015 (පුනර් පරීක්ෂණය) | 02 | 02 | - | - |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2013/14 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |
| | තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව - 2010/11 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |
| | තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව - 2009/10 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |
| 2018.09.11 | සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (බස්./උ.මැ./නැගෙ./සබර.) - 2017 | 41 | 35 | 06 | - |
| | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව (බස්./දකුණ/ඌව) - 2016/2017 | 53 | 50 | 02 | 01 |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 | 18 | 17 | 01 | - |
| | ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 | 22 | 17 | 04 | 01 |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 | 10 | 09 | 01 | - |
| | විගණන ඩිප්ලෝමා පාඨමාලාව - 2017 | 23 | 17 | 05 | 01 |
| | ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 | 14 | 11 | 01 | 02 |
| | සුළු මූල්‍යකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 | 10 | 04 | 06 | - |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016/17 (කුලියාපිටිය) | 38 | 35 | 03 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බැංකු හා මූල්‍ය කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව -2016/17 (මාතර) | 20 | 18 | 02 | - |
| | සමුපකාර සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව (වයඹ) - 2016/2017 (පුනර් පරීක්ෂණය) | 06 | 06 | - | - |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 (පුනර් පරීක්ෂණය) | 03 | 03 | - | - |
| | විගණන ඩිප්ලෝමා පාඨමාලාව - 2016 (පුනර් පරීක්ෂණය) | 03 | 03 | - | - |
| | ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 (පුනර් පරීක්ෂණය) | 07 | 06 | 01 | - |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 (පුනර් පරීක්ෂණය) | 12 | 12 | - | - |
| | ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව -2016 (පුනර් පරීක්ෂණය) | 02 | 02 | - | - |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2015 (පුනර් පරීක්ෂණය) | 02 | 02 | - | - |
| | බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2015 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2013 (පුනර් පරීක්ෂණය) | 01 | 01 | - | - |

### 2.3.4. මුද්‍රණාල අංශය

ආයතනයේ සියලුම පාඨමාලා සඳහා අවශ්‍ය කරන නිබන්ධන හා දේශන සටහන් මුද්‍රණය කිරීම හා පොත් සඟරා මෙන්ම බාහිර ආයතන මඟින් කෙරෙන ඉල්ලීම මත මුද්‍රණ කටයුතු කිරීම මුද්‍රණාල අංශය මඟින් කෙරෙන අතර මධ්‍යම මට්ටමේ මුද්‍රණාලයකට අවශ්‍ය කෙරෙන මුද්‍රණාල උපකරණවලින් සමන්විත අංග සම්පූර්ණ මුද්‍රණාලයක් ආයතනය සතුව පවතී.

### 2.3.5. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය

පුහුණු වැඩසටහන් වලදී අවශ්‍ය වන ශ්‍රව්‍ය දෘෂ්‍ය සහය සේවාව සැපයීම ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය මඟින් සිදු කරනු ලබයි. වීඩියෝ චිත්‍රපට ප්‍රදර්ශන යන්ත්‍ර, ශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍ර, ශබ්දවාහිනී යන්ත්‍ර පුහුණු වැඩසටහන් සඳහා ලබාදීම මෙන්ම ආයතනය විසින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් ඡායාරූප ගත කිරීම හා වීඩියෝ ගත කිරීමත් මෙම අංශයෙන් සිදු කරනු ලබන තවත් සේවාවකි.

### 2.3.6. ශ්‍රවනාගාරය



ආයතනික කාර්යභාරය විවිධාංගීකරණය යටතේ ජාතික හා ජාත්‍යයන්තර මට්ටමේ ශ්‍රවනාගාර අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ හා සමුපකාර ක්ෂේත්‍රයේ එකම ජාතික පුහුණු ආයතනය වශයෙන් ක්ෂේත්‍රයට දායාද කරනලද ආයතනික ශ්‍රවනාගාරය 2014.11.13 දින විවෘත කිරීමෙන් පසු 2015 වසරේ සිට ක්‍රියාත්මක තත්වයට පත්කිරීමට හැකියාව ලැබින.

2017 වසරතුල වැඩසටහන් 18 ක් පවත්වා රු.4,680,009.00 මුදලක් උපයන ලද අතර 2018 වසරේ දී වැඩසටහන් සංඛ්‍යාව 27 දක්වා ඉහළ ගිය අතර සමස්ථ ආදායම රුපියල් 6,836,956.52 ක් දක්වා වැඩි වී ඇත. අදායමේ මෙම වැඩිවීම 31.5 % ක ඉහළ යාමකි.





## 2.4. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය

**2.4.1.** 2018 වසරට අදාලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත. අදාල රැස්වීම් සදහා සහභාගීත්වය, සාකච්ජා කළ කරුණු සහ ලබා දුන් උපදෙස් හා තීරණ ප්‍රමාණය පහත පරිදිය.

**සහභාගීත්වය**

| නම | සහභාගිත්වය | | | |
|---|---|---|---|---|
| | 2018/03/22 | 2018/09/06 | 2018/10/26 | 2019/02/01 |
| කේ. කේ. එස්. ඒ. පෙරේරා මහතා | ✓ | ✓ | ✓ | ✓ |
| ජී .ආර්. කේ. එස්. ගනේගොඩ මහතා | ✓ | ✓ | ✓ | ✓ |
| එම්. එස්. එම්. රිස්මි මහතා | ✓ | ✓ | ab | ab |
| ඒ. එන්. එන්. පෙරේරා මහත්මිය | ✓ | ✓ | ✓ | ✓ |
| බී. කේ. එම්. ජේ. රුද්‍රිගු මහත්මිය | ✓ | ✓ | ✓ | ✓ |

- සාමාජිකත්වය නොමැති

**සාකච්ජා කළ කරුණු , ලබා දුන් උපදෙස් හා තීරණ ප්‍රමාණය**

| විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වූ දිනය | සහභාගීත්වය | සාකච්ඡා කළ කරුණු ප්‍රමාණය | ලබා දුන් උපදෙස් හා තීරණ ප්‍රමාණය |
|---|---|---|---|
| 2018.03.22 | 6 | 28 | 47 |
| 2018.09.06 | 6 | 25 | 33 |
| 2018.10.26 | 5 | 11 | 20 |
| 2019.02.01 | 5 | 23 | 30 |

එසේම 2018 වර්ෂය සඳහා අනුමත කළ අභ්‍යන්තර විගණන සැලැස්ම හා විගණන වැඩසටහන ඔස්සේ ආයතනයේ පාලන, අධ්‍යයන හා සංවර්ධන, මූල්‍ය, විභාග, නේවාසිකාගාර, පුස්තකාල, මුද්‍රණ, ශ්‍රව්‍ය දෘශ්‍ය, ශ්‍රවනාගාර, අලෙවි ප්‍රවර්ධන, තොරතුරු තාක්ෂණ, වෘත්තීය පාඨමාලා හා පරිගණක වැඩසටහන් යන අංශ ඔස්සේ විගණනයට ලක් කර කරුණු 118 ක් යටතේ අභ්‍යන්තර විගණන වාර්තා 17 ක් නිකුත් කර ඇත. එසේම 2018 වර්ෂය සඳහා රජයේ විගණන විමසුම් 12 ක් ලැබී ඇත. ඒ සඳහා පිළිතුරු ලබා දී ඇති අතර අභ්‍යන්තර විගණන වාර්තාවල හා රජයේ විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති කරුණු පාදක කරගනිමින් නිවැරදි කර ගැනීම් සිදු කර ඇත.

# 3. ආයතනික අභියෝග හා අපේක්ෂාවන්

## 3.1. අභියෝග

ජාතික සමුපකාර සංවර්ධන ආයතනය පිහිටු වීමේ පනත අනුව පැවරී ඇති සමස්ථ කාර්යභාරය ආයතනය විසින් ඉටු කිරීමට අපොහොසත් වී ඇතැයි යන්න මෙම ආයතනය වෙත එල්ලවෙන ප්‍රධාන චෝදනාවකි. එනම් පුහුණු වැඩසටහන් පැවැත්වීමට අමතරව සමුපකාර සංවර්ධනයට අදාල පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, සමුපකාර සමිති වලට අවශ්‍ය වෘත්තීය උපදෙස් සහ උපදේශනයන් සැපයීම, දුර්වල මට්ටමේ පවතින සමුපකාර ව්‍යවසායන් භාරගෙන කළමණාකරණය කිරීම, ආදර්ශ සමුපකාර ගම්මාන, මධ්‍යස්ථාන පිහිටුවීම ආදී කටයුතු පනත අනුව ඉටු කළ යුතුව ඇත.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා 71 දෙනෙකුගෙන් යුත් කාර්ය මංඩලයක් 2012 වර්ෂයේ සිට ආයතනය වෙත අනුමත වී ඇතත් පසුගිය කාලය පුරාම මෙම පූර්ණ කාර්ය මංඩලය ආයතනය සතුවී නොමැත. සෑම වර්ෂයකම 40 දෙනෙකුට වැඩි පුරප්පාඩු සංඛ්‍යාවත් පැවතීම හා එම බඳවා ගැනීම් සඳහා අනුමැතිය නොලැබීම ඊට හේතු වී ඇත. මේ නිසාම පුහුණු වැඩසටහන් පැවැත්වීමට අමතරව ඉටු කළ යුතු ඉහත සඳහන් කාර්යයන් ඉටු කිරීම ආයතනය අපොහොසත් වී ඇත. මෙම ගැටළුව ආයතනය කෙරේ දැඩිව බලපා ඇත.

එසේම සමුපකාර සංවිධාන අය කිරීමකින් තොරව පුහුණු වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කලද 2001 වර්ෂයේ සිට මෙම ආයතනය සංස්ථාගත ආයතනයක් වන බැවින් පුහුණු වැඩ සටහන් අය කිරීමකින් තොරව පැවැත්වීම සඳහා ප්‍රතිපාදන වෙන් වීමක් සිදු නොවේ. මේ අනුව පුහුණු කටයුතු සඳහා සහභාගිත්වයේ අඩුවක් පවතින අතර වැඩි සහභාගිත්වයක් ඇති කර ගැනීමට දැඩි උත්සාහයක් ගත යුතුව ඇත.

ආයතනික කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත තත්වයන් අභියෝගාත්මකව බලපාන බව සඳහන් කල හැක.

## 3.2. අපේක්ෂාවන්

ඉහත අභියෝගයන් ජය ගනිමින් 2019 වසර වඩාත් සාර්ථක වසරක් බවට පත් කර ගැනීම ආයතනයේ අපේක්ෂාවයි. ඒ අනුව සමස්ථ පුරප්පාඩු තනතුරු 43 සඳහා නව බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් කර ඇත.

එසේම සමුපකාර සමිති නිළධාරීන් සඳහා අයකිරීමකින් තොරව පුහුණු වැඩ සටහන් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කරමින් පවතී.

ආයතනය විසින් පවත්වන සමුපකාර පාඨමාලාවල තත්ත්වය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය මත දැනට ක්‍රියාත්මක වන ඩිප්ලෝමා පාඨමාලා සඳහා NVQ හා SLQF මට්ටම් ලබා ගැනීම ආයතනයේ අපේක්ෂාවයි.

එසේම දැනට ක්‍රියාත්මක ඩිප්ලෝමා පාඨමාලාවන්ට අදාලව උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දීම හා ඊට සමගාමීව උපාධි පාඨමාලාවක් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ආරම්භ කිරීමටද කටයුතු සැළසුම් කරමින් පවතී.

මේ අනුව සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත වෙනුවෙන් කාලීන අධ්‍යාපනික හා පුහුණු වැඩ සටහන් පැවැත්වීමට අදාල කටයුතු 2019 වර්ෂය තුල තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කිරීම ආයතනයේ අපේක්ෂාවයි.

**අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිළධාරී.**

# 4. මූල්‍ය වාර්තා

**සටහන :-** අවසාන ගිණුම් වලට අදාල ඉංග්‍රිසි පරිවර්ථන පිටපතෙහි විගණන දෙපාර්තමේන්තු මුද්‍රාව තබා ඇත.

## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව

| | සටහන් | 2017.12.31 දිනට රු. | 2018.12.31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 2 | 609,832,158 | 832,241,419 |
| අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 3.1 | 1,944,305 | 2,255,763 |
| | | **611,776,463** | **834,497,182** |
| ට්‍රාන්ස්ෆෝමරය මත විලම්බිත අයභාර වියදම් | 3.2 | 3,468,415 | 3,364,520 |
| **අඩුකලා** : ආදායමට එරෙහිව විලම්භිත අයභාර වියදම් ලිහාහැරීම | | (103,895) | (103,895) |
| විලම්භිත අයභාර වියදම් ඉතිරි ශේෂය | | 3,364,520 | 3,260,625 |
| **ජංගම වත්කම්** | | | |
| ජංගම ආයෝජන | 4 | 8,895,031 | 20,205,589 |
| වෙළඳ ණයගැතියෝ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ | 5 | 46,511,421 | 39,341,068 |
| තොග | 6 | 1,639,811 | 1,287,770 |
| බැංකුවේ ඇති මුදල් | 7 | 70,192,352 | 66,591,030 |
| | | **127,238,616** | **127,425,458** |
| **මුළු වත්කම්** | | **742,379,599** | **965,183,265** |
| **හිමිකම් සහ වගකීම්**<br>**ප්‍රග්ධනය හා සංචිත** | | | |
| ප්‍රග්ධනය | 8 | 233,254,215 | 233,254,215 |
| සමුච්චිත ලාභය/(අලාභය) | 9 | (83,550,308) | (81,212,192) |
| | | **149,703,907** | **152,042,023** |
| **සංචිත** | | | |
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 10 | 427,629,994 | 417,086,876 |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 11 | 15,474,343 | 14,564,450 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 20,901,444 | 258,253,098 |
| ආයතනික අරමුදල | | 4,884,730 | - |
| ප්‍රකාශන අරමුදල | | 6,035,563 | 6,703,035 |
| | | **474,926,074** | **696,607,459** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 6,554,435 | 7,254,295 |
| සමුපකාර අරමුදලින් ලද ණය | | 25,000,000 | 24,000,000 |
| | | **31,554,435** | **31,254,295** |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියන් සහ උපචිත වියදම් | 12 | 60,532,595 | 58,807,201 |
| රැඳවුම් මුදල් | | 25,662,588 | 26,472,286 |
| | | **86,195,183** | **85,279,487** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **742,379,599** | **965,183,265** |

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්ථාව**

| | සටහන් | සත්‍ය 2017 | සත්‍ය 2018 | අයවැය 2018 |
|---|---|---|---|---|
| **ආදායම්** | | රු. | රු. | රු. |
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 13 | 31,145,190 | 31,134,685 | 35,000,000 |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 26,260,692 | 26,453,011 | - |
| ආයතනික ඉපයීම් | 14 | 36,184,366 | 41,750,342 | 41,912,820 |
| | | 93,590,248 | 99,338,037 | 76,912,820 |
| **අඩුකලා : වියදම්** | | | | |
| 01. වැටුප් හා වේතන | 15 | 32,912,050 | 33,014,927 | 43,344,389 |
| 02. ගමන් වියදම් | 16 | 347,155 | 75,175 | 750,000 |
| 03. සැපයුම් | 17 | 4,498,298 | 4,874,160 | 5,769,580 |
| 04. නඩත්තු වියදම් | 18 | 981,193 | 2,426,771 | 5,697,000 |
| 05. ගිවිසුම් ගත සේවා | 19 | 19,108,120 | 19,955,190 | 23,338,000 |
| 06. වෙනත් | 20 | 1,918,204 | 2,146,903 | 2,290,000 |
| 07. ක්ෂය කිරීම් | 2 | 31,212,052 | 33,826,632 | - |
| 08. විලම්භිත වියදම් ලියාහැරීම | | 103,895 | 103,895 | - |
| | | 91,080,968 | 96,423,652 | 81,188,969 |
| ආදායම් බදු වලට පෙර සාමාන්‍ය ක්‍රියාකාරකම් වල වියදම් අභිබවා ගිය අතිරික්තය/(ඌනණය) | | 2,509,280 | 2,914,386 | (4,276,149) |
| **අඩු කලා** - බදු සඳහා වෙන් කිරීම් | | | | - |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය හෝ ( ඌනණය) | | 2,509,280 | 2,914,386 | (4,276,149) |
| **වෙනත් විස්තීර්ණ ආදායම්**<br>-දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභය | | - | 237,351,654 | - |
| ශුද්ධ අතිරික්තය/(ඌනණය) | | **2,509,280** | **240,266,039** | **(4,276,149)** |

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2017 රු. | | 2018 රු. | |
|---|---|---|---|---|
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනණය) | | **2,509,280** | | **2,914,386** |
| **ගැළපීම්** | | | | |
| **එකතු කලා -** | | | | |
| ක්ෂවීම් | 31,212,052 | | 33,826,632 | |
| විලම්භිත වියදම් ක්‍රමක්ෂය | 103,895 | | 103,895 | |
| පෙර වර්ෂ ගැලපීම් එකතු කිරීම් | (26,260,692) | | 5,068,502 | |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | - | | - | |
| බොල් ණය සඳහා වෙන් කිරීම | 182,373 | | 461,552 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 1,600,339 | | 1,451,312 | |
| අඩු කලා - ගිණුම්කරණ පැකේජය විකුණුම් ලාබ | (23,250) | | - | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | (26,260,692) | | (26,453,011) | |
| පොළී ආදයම | (504,360) | | (1,292,215) | |
| පාරිතෝෂික ගෙවීම් | - | | (751,452) | |
| රැඳවුම් මුදල් | - | | 54,790 | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාබ | (210,875) | | | |
| පෙර වර්ෂ ගැලපීම් අඩු කිරීම් | | | (5,644,771) | |
| ආයතනික අරමුදල් ගැලපීම් | | 6,099,482 | (4,884,730) | 1,940,504 |
| **කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව** | | **8,608,762** | | **4,854,890** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | | | |
| ණයගැති අඩුවීම් (වැඩිවීම්) | (6,629,540) | | 6,974,724 | |
| ණයහිමියෝ සහ උපචිත වියදම් වැඩිවීම් (අඩුවීම්) | 537,358 | | (1,725,394) | |
| තොග අඩුවීම් හා (වැඩිවීම්) | (505,239) | | 352,041 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ගලායෑම්** | | **(6,597,422)** | **5,601,371** | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලායෑම්** | | | | |
| රඳවාගත් මුදල් | 32,778 | | (345,110) | |
| දේපල, යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් | (2,464,990) | | (677,478) | |
| - ඉඩම් සංවර්ධනය | - | | - | |
| - ගොඩනැගිලි වැඩිදියුණුකිරීම | (29,213,821) | | (16,568,896) | |
| - යන්ත්‍ර පිරියත හා උපකරණ | (2,464,990) | | (677,478) | |
| - ලී බඩු සහ උපකරණ | (2,921,120) | | (314,750) | |
| - පුස්තකාල පොත් | (112,657) | | (2,700) | |
| - වෙනත් උපකරණ | - | | (220,398) | |
| කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධන ආයෝජන | (77,779) | | - | |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | (1,144,319) | | (11,349,446) | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල | 210,875 | | - | |
| පොළී ආදයම | 504,360 | | 1,026,292 | |
| | | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ගලායෑම්** | | **(35,186,673)** | | **(28,452,485)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලායෑම්** | | | | |
| භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන දීමනා | 8,000,000 | | 15,000,000 | |
| කාර්ය මණ්ඩල ණය | - | | (272,570) | |
| ආයතනික අරමුදල | 279,925 | | - | |
| ප්‍රකාශන අරමුදල | 596,266 | | 667,472 | |
| සමුපකාර අරමුදලේ ණය ආපසු ගෙවීම් | | | (1,000,000) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල් ගලා යෑම | | **8,876,191** | | **14,394,902** |
| වර්ෂය තුළ ශුද්ධ මුදල් ගලායෑම් වැඩිවීම් | | **(24,299,141)** | | **(3,601,322)** |
| කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | | **94,491,494** | | **70,192,352** |
| කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ | | **70,192,353** | | **66,591,030** |

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

| | ප්‍රාග්ධනය | ලාභ / අලාභ | ප්‍රාග්ධන ලැබීම (භාණ්ඩාගාර) | ප්‍රත්‍යාගණන අතිරික්ත | ප්‍රාග්ධන ලැබීම (අමාත්‍යාංශ) | අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2017.01.01 දිනට ශේෂය** | **233,254,215** | **(86,059,589)** | **445,505,845** | **20,901,444** | **15,858,435** | **10,044,102** | **639,504,452** |
| අඩුකලා: රජයේ ප්‍රතිපාදන මත මිලදී ගත් ස්ථාවර වත්කම් මත ක්ෂය | - | - | (25,875,850) | - | (384,092) | | (26,259,942) |
| කාලපරිච්ඡේදයේ ලාභ/පාඩු | - | 2,509,280 | - | - | | 596,266 | 3,105,546 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | | | | | |
| කාල පරිච්ඡේදය තුළ ආයෝජන | | | 8,000,000 | - | - | 279,925 | 8,279,925 |
| අඩුකලා : ක්ෂයවීම් | | | | | | | |
| **2017.12.31 දිනට ශේෂය** | **233,254,215** | **(83,550,309)** | **427,629,995** | **20,901,444** | **15,474,343** | **10,920,293** | **624,629,981** |
| **2018.01.01 දිනට ශේෂය** | 233,254,215 | (83,550,309) | 427,629,995 | 20,901,444 | 15,474,343 | 10,920,293 | 624,629,981 |
| අඩුකලා: රජයේ ප්‍රතිපාදන මත මිලදී ගත් ස්ථාවර වත්කම් මත ක්ෂය | - | - | (25,543,118) | - | (909,893) | - | (26,453,011) |
| කාලපරිච්ඡේදයේ ලාභ/පාඩු | - | 2,914,386 | - | 237,351,654 | | 667,472 | 240,933,511 |
| පෙර වර්ෂයේ ගැලපීම් එකතු කිරීම් | - | 5,068,502 | - | - | | - | 5,068,502 |
| පෙර වර්ෂයේ ගැලපීම් අඩු කිරීම් | - | (5,644,771) | - | - | - | (4884730) | 10,529,501 |
| කාල පරිච්ඡේදය තුළ ආයෝජන | - | - | 15,000,000 | - | - | - | 15,000,000 |
| **2018.12.31 දිනට ශේෂය** | **233,254,215** | **(81,212,192)** | **417,086,877** | **258,253,098** | **14,564,450** | **6,703,035** | **848,649,483** |

## 2018.12.31 දිනට ගිණුම් සම්බන්ධ සටහන්

## සටහන් 01

### 1.1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 1.1.a. පොදු ගිණුම්කරණ සම්ප්‍රදායයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන වාර්ථාව, හිමිකම් වෙනස්වීමේ වාර්ථාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැය තොරතුරු ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට සටහන් වලින් සමන්විත වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත සහ මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යංශයේ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් 2018.05.10 දිනැතිව නිකුත් කරන ලද අංක 265/2018 දරන චක්‍ර ලේඛය අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් 2018.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි යොදාගෙන ඇත. එසේ වුවද අදාල රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවල, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අදාල කරගෙන ඇත.

#### 1.1.b. ගිණුම් ආකෘති

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ගිණුම් ආකෘතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. වර්තමාන වර්ෂය සමඟ ඒකීය වන අයුරින් පෙර වර්ෂවල වාර්තා අගයන් සහ ප්‍රකාශනයන් යළි සකස් කොට ඇත.

#### 1.1.c. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට භාජනය කර ඇති අතර, අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### 1.2 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

#### 1.2.a. දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගත් පිරිවැය හෝ ඉදිකිරීමට වැය කරන ලද අගය සමඟ ඒවායේ පිරිවැය හා අදාල කරගත හැකි අනෙකුත් වියදම් සමඟ ඉදිරිපත් කොට ඇත. දේපල, පිරියත සහ උපකරණ ගිණුම්ගත කොට ඇත්තේ පිරිවැය හෝ ප්‍රති අගය කරන ලද වටිනාකමෙන්, පහත සඳහන් අනුපාතයන්ට අනුව කරන ලද සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවයි.

#### 1.2.b. ක්ෂය කිරීම

වත්කම්වල පිරිවැය, ඒවායෙහි ඇස්තමේන්තු ගත ඵලදායි ජීවිත කාලය පුරා සමාන වාර්ෂික වාරික වලින් ලියා හැරීම පදනම් කොට ගෙන පහත සඳහන් පරිදි ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් ගණනය කොට ඇත.

| වත්කම | ඵලදායි ජීවිත කාලය |
|---|---|
| ගොඩනැඟිලි | වර්ෂ 40 |
| මෝටර් රථ වාහන | වර්ෂ 04 |
| ලීබඩු සහ උපකරණ | වර්ෂ 10 |
| පොත් සහ සඟරා | වර්ෂ 04 |
| යන්ත්‍ර සූත්‍ර - විදුලි ජනක | වර්ෂ 20 |
| යන්ත්‍ර සූත්‍ර - ශ්‍රවනාගාර වායු සමන යන්ත්‍ර | වර්ෂ 10 |
| යන්ත්‍ර සූත්‍ර - ඉහත නොවන | වර්ෂ 05 |
| ඉහුම් පිහුම් උපකරණ හා අනෙකුත් දෑ | වර්ෂ 03 |

ස්ථාවර වත්කම් වෙනුවෙන් ක්ෂය කිරීම් කාලය පදනම් කර සිදුකෙරේ.

විදුලිය බල මණ්ඩලය වෙතින් සපයන ලද රු.4,155,818.00 ක් වටිනා ට්‍රාන්ස්පෝමර් 02 ක් වෙනුවෙන් දරන ලද වියදම විලම්භනයට පෙර, එහි පිරිවැය වසර 40 ක කාලයක් තුළ ලාභලාභ ගිණුමට ලියා හැරී සිදු කෙරේ.

## 1.3 වගකීම් සහ වෙන් කිරීම්

### 1.3.a. පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

ශේෂ පත්‍ර දිනයේ සිට වාර්ෂික සේවා කාලයක් ඉක්මවා ඇති සේවා දායකයින් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව විශ්‍රාම ගැන්වීමේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට අනුකූලව සේවාදායකයින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හිමිකම් කියනු ලබයි. ආයතනය විසින් පිළිවෙලින් 15% සහ 3% වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවාදායකයන්ගේ මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව මත දායක වනු ඇත.

### 1.3.b. බොල් ණය සඳහා ප්‍රතිපාදන

5% බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

### 1.3.c. අනෙකුත් වගකීම්

රජයේ නිවාසයක පදිංචි වී සිටි හිටපු සේවකයෙකුගෙන් නිවාස කුලිය හා දඩ මුදල් ලෙස රුපියල් 645,122'00/- ක මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. ආයතනයට එරෙහිව හිටපු සේවකයෙක් නඩු 04 ක් ගොනු කර ඇත.

## 1.4 ආදායම් සහ වියදම් ගිණුම්

### 1.4.a. ආදායම් හඳුනාගැනීම

- සපයන ලද සේවා සඳහා ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.
- ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා ගාස්තු සහ ආයෝජන මත ඉපයූ පොළී සේවා සපයනු ලැබූ කාලය පදනම් කරගෙන ගිණුම්ගත කර ඇත.

### 1.4.b. වියදම්

රක්ෂණ ගාස්තු සහ වාහන බලපත්‍ර ගාස්තු හැර අනෙකුත් සියළු වියදම් උපචිත සංකල්පයට අනුව ගිණුම්ගත කරනු ලැබේ. රක්ෂණ ගාස්තු සහ වාහන බලපත්‍ර ගාස්තු කාල පරිච්ඡේද පදනම මත ගිණුම් ගතකර ඇත.

## 1.5 රජයේ ප්‍රදාන

### 1.5.a. ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රාග්ධන ස්වරූපයෙන් ලැබුණු රජයේ ප්‍රදාන මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි සංචිත ලෙස සළකා කටයුතු කර ඇත. ප්‍රාග්ධන ප්‍රදාන මගින් මිලදී ගනු ලබන ස්ථාවර

වත්කම් මත ක්ෂය කිරීම් සංචිත වලින් අඩු කර ආදායම් වියදම් ගිණුමේ බැරට ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදාන ලෙස සටහන් කරනු ලැබේ.

**1.5.b. පුනරාවර්තන ප්‍රදාන**

ප්‍රතිපාදන ලැබූ වර්ෂයේ ආදායම් ලෙස ආදායම් සහ වියදම් ගිණුමේ ගිණුම්ගත කරනු ලබන අතර, වියදම් නොකරන ලද පුනරාවර්තන ප්‍රදාන වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේදී මහජන බැංකුවෙන් ප්‍රදාන ලැබී නැත. නමුත් 2016 වසරතුල ලද ප්‍රදාන වලින් 2018.01.01 දින වන විට වියදම් නොවූ රු.411,647.26 ක මුදලින් රු.63,699.60 වියදම් කර පුහුණු වැඩ සටහනක් 2018 වසර තුල පවත්වා ඇත. එම මුදල ආදායම් වියදම් ගිණුමේ පුනරාවර්තන ප්‍රදාන ලෙස පෙන්වා ඇත. වියදම් නොකල ප්‍රදාන ණයහිමියන් යටතේ සඳහන් කර ඇත.

**1.6** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ කළමනාකාරිත්වයේ වගකීමකි

**1.7.** ගබඩාවේ හා මුද්‍රණාලයේ 2018/12/31 දිනට පැවති තොග "සාමාන්‍යකරණ ක්‍රමය" මත ගණනය කර ඇති අතර, මුද්‍රිත ද්‍රව්‍යයන් ඒවායේ පිරිවැය මත වටිනාකම සකසා ඇත.

**1.8** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙල කර ඇත.

**1.9** ස්ථිර සේවකයින් 30 ක් හා අනියම් සේවකයින් 03 ක් ද පුහුණුලාභීන් 04 දෙනෙකුද 2018/12/31 දිනට සේවයේ නියුක්ත වු අතර, ඊට අමතරව රේඛීය අමාත්‍යාංශය වෙතින් අනියුක්ත කළ සංවර්ධන නිළධාරීන් 07 දෙනෙකු සේවා නියුක්ත විය.

**1.10** සමුපකාර විෂයට අදාල ග්‍රන්ථ ප්‍රකාශයට පත්කිරීමේ අරමුණින් රේඛීය අමාත්‍යාංශයෙන් රු.මි.3.4ක් ලැබී ඇත.මෙම අරමුදලට අදාල ගණුදෙනු වෙනම පොත් කට්ටලයක පවත්වා ගෙන යායුතු බවට රේඛීය අමාත්‍යාංශය විසින් උපදෙස් දී ඇති පරිදී අදාල පොත් කට්ලය පවත්වගෙන යනු ලබන අතර 2018 වර්ෂය සඳහා වූ ආදායම් වියදම් සහ මූල්‍ය තත්ව ප්‍රකාශය අමුණා ඇත.

**1.11** සමාලෝචිත 2018 වසරතුලදී ප්‍රකාශණ අරමුදල් ආයෝජනය තුලින් උපයන ලද පොළී ආදායම රු.584,658.81 කි. මෙම ආදායම් අදාල අරමුදල් වෙත ආදායම් වියදම් ගිණුම ඔස්සේ බැරකර ඇත.

**1.12** වසර 2006-2015 කාල පරාසයට අදාලව ජීවන වියදම් දීමනාව ඇතුලත්ව සේවා නියුක්ති හා සේවක භාරකාර අරමුදල් ගෙවීමේ ක්‍රමය මත සේවා නියුක්තියන්ගේ භාර අරමුදල වෙත රු.4,181,639.79 මුදලක් හා සේවක භාරකාර අරමුදල වෙත රු.501,796.97 මුදලක් හිඟ මුදල් වශයෙන් ගෙවීමට තිබුණ අතර වසර 2006 - 2015 කාල පරාසය තුල ජීවන වියදම් දීමනාව මත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට රුපියල් 501,796.92/- ක්ද සේවක අර්ථ සාධක අරමුදලට රුපියල් ක් 4,181,639.79/- ක හිඟ ධායක මුදලක් තිබුණු අතර එම මුදල් 2018 වර්ෂය තුල ගෙවා ඇත.

**1.13** විගණන හා කළමණාකරණ කමිටුව විසින් කරන ලද යෝජනාවකට අනුව කළමණාකරණ මංඩලයේ අනුමැතිය යටතේ ආයතනික අරමුදල ස්ථාපිත කරන ලදී.

**ස්ථාපිත කරන ලද අරමුදලේ ප්‍රධාන අරමුණු -**

1. තනතුරින් විශ්‍රාම ගැනීමේදී හෝ අස්වී යාමේදී පාරිතෝෂික දීමනා සඳහා හිමිකම් ලබන සේවකයින්ට පාරිතෝෂික ගෙවීම.
2. ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රය සඳහා ක්‍රියාත්මක කරන පුහුණු පාඨමාලා වල පිරිවැය දැරීම.

ඉහත අරමුණු වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමට එම ගිණුම ආයතනික අරමුදල නමින් මහජන බැංකුවේ විවෘත කිරීමට කටයුතු කරන ලදී.

ආදායම් මත තීරණය කරගත් ප්‍රතිශත මුදලක් ආදායම් වියදම් ගිණුමට එරෙහිව ආයතනික අරමුදලට මාරු කර එම මුදල ඉහත ගිණුමේ මුදලින් තැන්පත් කරන ලදී.

2018 වර්ෂයේදී කළමණාකරණ මංඩලය විසින් මෙම අරමුදලේ නම පාරිතෝෂික අරමුදල නමින් වෙනස් කිරීමට හා එහි මුදල් පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා පමණක් භාවිතා කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව, ආයතනික අරමුදලේ නම පාරිතෝෂික අරමුදල් ගිණුම ලෙස වෙනස් කරන ලදී.

2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආදායම් වියදම් ගිණුමට එරෙහිව ආයතනික අරමුදලට වෙන් කිරීම් මෙන්ම පාරිතෝෂික අරමුදලට වෙන් කිරීම් කපා හැර අදාල ගිණුම් වලට බැර කිරීමට කටයුතු කර ඇත.

කළමණාකරණ මංඩලය විසින් ආයතනික අරමුදලේ නම හා අරමුණ වෙනස් කිරීම හේතුවෙන් ආදායම් වියදම් ගිණුමට එරෙහිව සටහන් කල ගනුදෙනු සියල්ල ප්‍රතිසටහන් කර ආයතනික අරමුදල වසා දැමීමට කටයුතු කරන ලදී.

**සටහන : 02**

දේපල, පිරියත හා උපකරණ

| පිරිවැය/ ප්‍රත්‍ය අගය | 2018.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් | | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් (එකතු කිරීම්) | ගැලපීම් (අඩු කිරීම්) | 2018.12.31 දිනට සත්‍ය අගය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | එකතු කිරීම් | අඩු කිරීම් | | | | | |
| ඉඩම් | 135,040,306.01 | - | - | 135,040,306.01 | - | 64,459,694 | - | 199,500,000.00 |
| ගොඩනැගිලි සහ ආකෘති | 489,152,838.34 | - | - | 489,152,838.34 | 17,617,352 | 567,800,000 | (489,152,838) | 585,417,351.66 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 102,273,686.65 | - | - | 102,273,686.65 | 790,568 | - | | 103,064,254.78 |
| රථවාහන | 16,914,588.00 | - | - | 16,914,588.00 | - | - | - | 16,914,588.00 |
| ගෘහ භාණ්ඩ | 45,503,969.47 | - | - | 45,503,969.47 | 331,000 | - | | 45,834,969.47 |
| පුස්තකාල පොත් | 2,497,389.35 | 1,022 | (25,000) | 2,473,411.35 | 2,700.00 | - | | 2,476,111.35 |
| තිරරෙදි සහ වෙනත් | 1,879,572.25 | - | - | 1,879,572.25 | 220,398.00 | - | - | 2,099,970.25 |
| **එකතුව** | **793,262,350.07** | - | **(25000)** | **793,238,372** | **18,962,018** | **632,259,694** | **(432,259,694)** | **955,307,245.51** |
| සමුච්චිත ක්ෂය | 2018.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් | | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් (එකතු කිරීම්) | ගැලපීම් (අඩු කිරීම්) | 2018.12.31 දිනට සත්‍ය අගය රු. |
| | | එකතු කිරීම් | අඩු කිරීම් | | | | | |
| ගොඩනැගිලි සහ ආකෘති | 85,959,342.84 | - | - | 85,959,342.84 | 16,350,973 | - | **(94,244,798.09)** | 8,065,517.75 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 59,338,582.56 | - | - | 59,338,582.56 | 12,915,416 | - | | 72,253,998.56 |
| රථවාහන | 13,702,087.00 | - | - | 13,702,087.00 | 650,000 | - | - | 14,352,087.00 |
| ගෘහ භාණ්ඩ | 20,297,950.91 | - | - | 20,297,950.91 | 3,782,089 | - | | 24,080,039.91 |
| පුස්තකාල පොත් | 2,350,130.39 | 1,022 | (25,000) | 2,326,152.39 | 58,117 | - | - | 2,384,269.39 |
| තිරරෙදි සහ වෙනත් | 1,859,877.00 | - | - | 1,859,877.00 | 70,037 | - | - | 1,929,914.00 |
| **එකතුව** | **183,507,971** | **1,022** | **(25,000)** | **183,483,993** | **33,826,632** | - | **(94,244,798.09)** | **123,065,827** |
| **දළ පොත් අගය** | 793,262,350 | - | **(25,000)** | 793,238,372 | | | - | **955,307,246** |
| **සමුච්චිත ක්ෂය** | 183,507,971 | - | **(25,000)** | 183,483,993 | | | - | **123,065,827** |
| **ශුද්ධ අගය** | **609,754,379** | - | - | **609,754,379** | | | - | **832,241,419** |
| (ප්‍රාග්ධන) නොනිමි වැඩ | 2018.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් | | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් (එකතු කිරීම්) | ගැලපීම් (අඩු කිරීම්) | 2018.12.31 දිනට සත්‍ය අගය රු. |
| | | එකතු කිරීම් | අඩු කිරීම් | | | | | |
| නේවාසිකාගාර E,H අළුත් වැඩියාව | 77,779 | | | 77,779.07 | | | | |
| | 77,779 | | | 77,779 | | - | (77,779) | |
| **ඉදිරියට ගෙන ගිය අගය** | **609,832,158** | | | **609,832,158** | | | | **832,241,419** |

| | 2017<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| **සටහන - 03.1** | | |
| **වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| ලංකා විදුලිබල මණ්ඩලයේ තැන්පතු | 813,750 | 813,750 |
| කාර්ය මණ්ඩල ණය | 1,130,555 | 1,442,013 |
| | **1,944,305** | **2,255,763** |

| **සටහන - 04.1** | **2017** | **2018** |
|---|---|---|
| **කෙටිකාලීන ආයෝජන** | රු. | රු. |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | 8,014,476 | 19,363,922 |
| කාර්ය මණ්ඩල ණය | 880,555 | 841,667 |
| | **8,895,031** | **20,205,589** |

| **සටහන - 05** | **2017** | **2018** |
|---|---|---|
| **වෙළඳ ණය ගැතියන්ගෙන් හා අනෙකුත් ලැබිය යුතු ශේෂ** | රු. | රු. |
| 3501 - 3512 අයවිය යුතු පාඨමාලා ගාස්තු ( උප ලේඛන : 5A) | 2,099,723 | 2,156,442 |
| 3504 අයවිය යුතු බාහිර වැඩසටහන් ගාස්තු | 1,341,995 | 2,592,787 |
| 3513 අයවිය යුතු මුද්‍රණ සේවා ගාස්තු | 135,223 | 11,776 |
| 3514 වෙනත් සේවාවන් සැපයීම වෙනුවෙන් ලැබිය යුතු ගාස්තු | 322,924 | 283,624 |
| 3402 කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 5,007,472 | - |
| 3403 ආරක්ෂක තැන්පතු | 75,000 | 75,000 |
| 3515 ආයෝජන මත ලැබිය යුතු පොලී | 276,676 | 542,598 |
| 3518 අයවිය යුතු නේවාසික ගාස්තු | 75,000 | 13,720 |
| 3520 අයවිය යුතු නිවාස කුලී | 645,122 | 645,122 |
| 3522 පුස්තකාල ගාස්තු හා විභාග ගාස්තු<br>3523 සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | <br>138,800 | 6,700<br>138,800 |
| 3524 ආහාර සඳහා කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල | 11,910 | 6,950 |
| 3525 ආහාර සඳහා සමුපකාර පරීක්ෂකවරුන්ගේ අයවිය යුතු මුදල | 130,896 | - |
| 3526 ලැබිය යුතු දඩ මුදල් | 40 | - |
| 3527 අයවිය යුතු උත්සව අත්තිකාරම් | 31,250 | 47,250 |
| 3532 කාර්ය මණ්ඩල සඳහා අත්තිකාරම් | 9000 | - |
| 3535 ගිණුම් අතර මාරු කිරීම් | - | - |
| 3539 එකතු කළ අගය මත බදු (Vat) | 37,622,839 | 33,933,319 |
| 3540 රඳවා ගැනීම් බදු | 17,505 | 45,627 |
| 3547 රක්ෂණ ගාස්තු පෙර ගෙවුම් | 340,099 | 705,141 |
| 3548 අයවිය යුතු බස් ගාස්තු | - | |
| 3549 අයවිය යුතු ගොඩනැගිලි කුලී | 315,500 | 118,948 |
| 3551 ගෙවත්තෙන් අයවිය යුතු ආදායම් | 20,655 | 3,523 |
| 3350 අමාත්‍යාංශය වෙතින් සංවර්ධන නිළධාරී ලැබිය යුතු වැටුප් | | |
| ප්‍රකාශන ගිණුම -ii වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 25,049 | 39,695 |
| **අඩු/අඩමාන ණය සඳහා වෙන් කිරීම්** | **(1,564,803)** | **(2,025,954)** |
| **අඩමාන ණය සඳහා විශේෂ වෙන් කිරීම්** | **(566,455)** | **-** |
| | **46,511,421** | **39,341,068** |

| සටහන - 06 | 2017 රු. | 2018 රු. |
|---|---:|---:|
| තොග | | |
| 3301 ලිපි ද්‍රව්‍ය | 341,582 | 380,560 |
| 3302 මුද්‍රණ ද්‍රව්‍ය | 546,379 | 236,585 |
| 3303 ගොඩනැගිලි ද්‍රව්‍ය | 105,415 | 136,417 |
| 3304 ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය | 6,552 | 6,552 |
| 3305 විවිධ තොග | 370,842 | 305,392 |
| 3306 ප්‍රකාශන - (පොත් හා සටහන්) | 254,974 | 208,198 |
| ප්‍රකාශන ii - මුද්‍රණ ද්‍රව්‍ය තොගය | **14,067** | **14,067** |
| | **1,639,811** | **1,287,770** |

| සටහන - 07 | | 2017 | 2018 |
|---|---|---:|---:|
| බැංකුවේ ඇති මුදල් (මහජන බැංකුව කටුගස්තොට) | | රු. | රු. |
| ප්‍රකාශන ගිණුම | 0089 1001-92649564 | 259 | - |
| අධ්‍යාපන හා පුහුණු ගිණුම | 0089-1001-32648143 | 16,269,659 | 13,032,435 |
| එලදායිතා ගිණුම | 089-1001-38092-967 | 238,856 | 238,856 |
| රජයේ ගිණුම | 0089-1001-92648140 | 49,815,997 | 50,151,634 |
| සේවා ගාස්තු ගිණුම | 0089-1001-5000-2158 | 437,620 | 258,346 |
| පාරිතෝෂික අරමුදල | 089-2001-90030993 | 3,030,555 | 2,396,338 |
| ප්‍රකාශන ගිණුම ii | 089-1001-50018442 | 399,407 | 513,422 |
| | | **70,192,353** | **66,591,030** |

| සටහන - 08 | 2017 | 2018 |
|---|---:|---:|
| ප්‍රාග්ධනය | රු. | රු. |
| 01.01 දිනට ශේෂය | 233,254,215 | 233,254,215 |
| එකතු කිරීම්/ අඩු කිරීම්: ගැලපුම් | - | |
| | **233,254,215** | **233,254,215** |

| සටහන - 09 | 2017 | 2018 |
|---|---:|---:|
| සමුච්චිත ලාභ/(පාඩු) | රු. | රු. |
| 01. 01 දිනට ශේෂය | (86,059,589) | (83,550,308) |
| එකතු කිරීම්/ අඩු කිරීම් : පෙර වර්ෂයේ ගැලපීම් | | |
| වෙනත්- එකතු කිරීම් | - | 5,068,502 |
| වෙනත්- අඩු කිරීම් | - | (5,644,771) |
| | - | **(576,270)** |
| **පෙර වර්ෂයේ ගැලපීම්වලට පසු සමුච්චිත ලාභ/(පාඩු)** | **(86,059,589)** | **(84,126,578)** |
| එකතුකලා : කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | 2,509,280 | 2,914,386 |

| | | |
|---|---|---|
| | **2,509,280** | **2,914,386** |
| **12. 31 දිනට අත ඉතිරිය** | **(83,550,308)** | **(81,212,192)** |

| **සටහන - 10** | **2017 රු.** | **2018 රු.** |
|---|---|---|
| **භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන** | | |
| 01.01. දිනට ශේෂය | 445,505,844 | 427,629,994 |
| එකතු කිරීම්/ගැලපීම් | - | |
| | **445,505,844** | **427,629,994** |
| එකතු කලා : වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | 8,000,000 | 15,000,000 |
| | **453,505,844** | **442,626,994** |
| අඩු කලා : ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම් | (25,875,850) | (25,543,118) |
| | **427,629,994** | **417,086,876** |

| **සටහන - 11** | **2017** | **2018** |
|---|---|---|
| **අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන., සමූපකාර අරමුදල සහ වෙනත්** | රු. | රු. |
| 01.01 දිනට ශේෂය | 29,323,029 | 29,323,779 |
| එකතුකලා : වර්ෂය සඳහා ලැබීම් | 750 | - |
| | 29,323,779 | 29,323,779 |
| අඩු කලා : ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම් | (13,849,435) | (14,759,328) |
| | **15,474,343** | **14,564,450** |

| **සටහන - 12**<br>**ණය හිමියන් සහ උපචිත වියදම්** | **2017**<br>**රු.** | **2018**<br>**රු.** |
|---|---|---|
| 4001 දුරකථන ගාස්තු | 114,330 | 67,992 |
| 4002 ජල ගාස්තු | - | - |
| 4003 විදුලි ගාස්තු | 119,702 | 143,042 |
| 4004 දේශන ගාස්තු | 1,009,138 | 318,556 |
| 4005 වෙනත් උපචිත වියදම් | 664,125 | 683,617 |
| 4008 යැපීම් දීමනා පාලන ගිණුම් | 72,450 | 72,450 |
| 4015 ගෙවිය යුතු රජයේ විගණන ගාස්තු | 844,925 | 1,250,425 |
| 4016 භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු මුදල් | 275,738 | 113,616 |
| 4018 බාහිර වැඩසටහන් සඳහා අත්තිකාරම් ලැබීම් | 86,937 | 1,773,050 |
| 4019 ආරක්ෂක සේවා | 447,510 | 440,200 |
| 4020 සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා | 1,195,654 | 691,301 |
| 4021 රෙදි සේදීමේ සේවාව | 1,150 | - |
| 4022 ගොඩනැගිලි ඉදිකිරීම්- (CECB හා අනෙකුත්) | 47,374,205 | 47,374,205 |
| **(ආකෘතිය : 12A අනුව) අත්තිකාරම් ලැබීම්** | 1,487,715 | 1,662,676 |
| 4027 සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ගෙවීම් | 135,364 | 50,249 |
| 4028 බස්රථ කුලී සඳහා අත්තිකාරම් ලැබීම් | - | - |
| 4035 වැටුප් පාලන ගිණුම (අනියම් සේවකයින්) | 86,733 | 98,674 |
| 4040 ආපසු ගෙවිය යුතු පාඨමාලා ගාස්තු | 75,750 | 155,765 |
| 4041 ඵලදායිතා පාලන ගිණුම | 238,856 | 238,856 |
| 4060 රසපිරි කේටර්ස් | 211,988 | - |
| 3902 ආරක්ෂිත තැන්පතු | 637,063 | 371,808 |
| 4043 වැට් බද්ද | 3,046,968 | - |
| 3903 ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 192,650 | 394,588 |
| 4058 වන්දි සඳහා වෙන් කිරීම | - | - |
| 4048 රුචිර කේටරස් වෙත ගෙවිය යුතු | 9,204 | 1,024,101 |
| 4049 ගෙවිය යුතු ඉන්ධන ගාස්තු | 67,490 | 112,844 |
| 4057 මහජන බැංකුවෙන් ලද අත්තිකාරම් | 440,253 | 347,948 |
| 4059 ප්‍රකාශන අලෙවිය මත AAT ආයතනය වෙත ගෙවිය යුතු මුදල් | 17,408 | - |
| 4061 ප්‍රයෝජනයට නොගත් වසරේ පුනරාවර්තන ප්‍රතිපාදන | 543,744 | - |
| 4061 ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 171,643 | 164,683 |
| 4063 කලින් ලැබූ නේවාසිකාගාර ආදායම | 794,925 | 265,650 |
| 4065 රඳවා ගැනීමේ බදු | 60,635 | 196,368 |
| 4064 ගෙවිය යුතු උපදේශන ගාස්තු | | 701,770 |
| ii ණය හිමියෝ සහ උපචිත වියදම් | 108,345 | 92,770 |
| | **60,532,595** | **58,807,201** |

| සටහන - 13 | 2017 රු. | 2018 රු. | අයවැය රු |
|---|---|---|---|
| **පුනරාවර්තන ප්‍රදානයන් (කේත අංක :11)** | | | |
| 1021 භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රතිපාදන | 30,610,443 | 31,070,985 | 35,000,000 |
| 1044 සමුපකාර අරමුදලින් ලැබූ ප්‍රතිපාදන | 534,747 | 63,700 | |
| | **31,145,190** | **31,134,685** | **35,000,000** |

| | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|
| **සටහන - 14** | රු | රු | රු |
| **අනෙකුත් ආදායම් (කේත අංක : 11)** | | | |
| 1001 - 1011 පාඨමාලා ගාස්තු - ආකෘති 14 - A | 16,673,912 | 17,156,276 | 18,862,520 |
| 1012 කාමර ගාස්තු | 6,777,377 | 8,340,807 | 9,149,300 |
| 1014 දේශන ශාලා ගාස්තු | 2,100,000 | 3,214,060 | 5,500,000 |
| 1014 ශ්‍රවනාගාර ගාස්තු | 4,680,009 | 6,836,957 | 6,300,000 |
| 1015 නිවාස කුලී | 401,446 | 439,450 | 420,000 |
| 1017 ප්‍රකාශන විකුණුම් ආදායම් | 7,636 | - | 100,000 |
| 1018 සේවා ගාස්තු | 128,900 | 105,000 | - |
| 1023 මුද්‍රණ සේවා | 102,234 | 16,015 | 50,000 |
| 1024 පුස්තකාල ගාස්තු | 55,500 | 42,000 | 91,000 |
| 1025 විභාග ගාස්තු | 151,537 | 193,629 | - |
| 1026 ස්ථාවර තැන්පතු ඉතිරිකිරීමේ හා ආරක්ෂක තැන්පතු පොලී | 504,360 | 1,191,499 | 700,000 |
| 1027 කාර්ය මණ්ඩල ණය සඳහා පොලි | 88,290 | 100,716 | 80,000 |
| 1035 ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 188,922 | 63,913 | - |
| ආවස්ථික පිරිවැය සහණදායි ණය පොලී | 161,889 | 225,947 | - |
| 1036 ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | 234,125 | - | 150,000 |
| විවිධ ආදායම්- (ආකෘති 14-B) | 1,922,414 | 1,681,109 | 1,950,000 |
| 1043 ආහාර සැපයීම මත කොමිස් | 697,696 | 1,366,101 | 1,200,000 |
| 1069 ගොඩනැගිලි කුලී ආදායම | 811,500 | 378,500 | 360,000 |
| 1063 ජාතිය ගොඩනැගීමේ බදු | 279,418 | 398,362 | - |
| 1085 නොගෙවූ වන්දි | 217,200 | - | - |
| | **36,184,366** | **41,750,342** | **41,912,820** |

| සටහන - 15 | 2017 | 2018 | අයවැය |
|---|---|---|---|
| **සේවක පිරිවැය (කේත අංක : 01)** | රු | රු | රු |
| 101 වැටුප් හා වේතන | 20,919,231 | 20,613,196 | 29,564,313 |
| 151 දේශන ගාස්තු | 4,070,849 | 4,858,838 | 5,017,690 |
| 103 අතිකාල දීමනා | 181,807 | 206,047 | 450,000 |
| 104 දීමනා | 1,395,048 | 586,741 | 300,000 |
| 105 සේවක අර්ථ සාධක අරමුදල (ආයතන දායකත්වය) | 2,448,617 | 2,618,727 | 4,019,097 |
| 106 සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වය | 489,723 | 523,745 | 803,819 |
| 153 විභාග අධීක්ෂණ ගාස්තු | 119,800 | 166,097 | 173,200 |
| 154පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු | 299,004 | 404,118 | 737,200 |
| 110 කළමනාකරණ මණ්ඩල සහභාගිත්ව දීමනා | 120,000 | 204,000 | 480,000 |
| 112 නිවාඩු දින වැටුප් හා අනෙකුත් | 61,278 | 229,194 | 150,000 |
| 114 වැඩ බැලීමේ දීමනා | - | 69,574 | - |
| 115 විගණන කමිටු දීමනා | 72,000 | 114,000 | 96,000 |
| 155 ප්‍රශ්න පත්‍ර සැකසීමේ ගාස්තු | 135,670 | 133,720 | 182,000 |
| 156 පිළිතුරු පත්‍ර බැලීමේ ගාස්තු | 414,200 | 337,420 | 515,600 |
| 118 පාරිතෝෂික දීමනා | 1,600,338 | 1,451,312 | 600,000 |
| 119 විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායකත්වය | 212,271 | 161,909 | 82,620 |
| 158 උපදේශන ගාස්තු | 129,360 | 78,000 | 172,800 |
| 159 පාඨමාලා පරිපාලන ගාස්තු | 80,965 | 32,344 | - |
| සහනදායී ණය මත සේවාදායකයින්ගේ ප්‍රතිලාභ | 161,889 | 225,947 | - |
| | **32,912,050** | **33,014,927** | **43,344,389** |

| සටහන - 16 | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **ගමන් වියදම් (කේත අංක :02)** | | | |
| 201 දේශීය | 112,491 | 75,175 | 250,000 |
| 202 විදේශීය | 234,664 | - | 500,000 |
| | **347,155** | **75,175** | **750,000** |

| සටහන -17 | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා (කේත අංක : 03)** | | | |
| 301 ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 480,719 | 601,973 | 857,000 |
| 302 ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,392,715 | 1,591,638 | 1,983,760 |
| 303 මුද්‍රණ ද්‍රව්‍ය | 461,889 | 572,898 | 400,000 |
| 304 පුවත් පත් සහ වාර සඟරා | 39,260 | 45,250 | 70,000 |
| 306 ආහාර වියදම් | 1,315,834 | 1,624,114 | 1,508,820 |
| 307 යාන්ත්‍රික හා විදුලි උපකරණ | 104,712 | 184,292 | 400,000 |
| 310 වෙනත් සැපයුම් | 622,550 | 100,003 | 400,000 |
| 313 වතුර බෝතල් පිරිවැය | 80,820 | 153,992 | 150,000 |
| | **4,498,298** | **4,874,160** | **5,769,580** |

| සටහන - 18 | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **නඩත්තු වියදම් (කේත අංක :04)** | | | |
| 401 රථවාහන | 437,197 | 731,972 | 1,114,000 |
| 402 යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 263,484 | 732,817 | 2,033,000 |
| 403 ගොඩනැගිලි | 160,752 | 919,398 | 2,200,000 |
| 404 ගෘහ භාණ්ඩ | 43,295 | 4,000 | - |
| 405 පරිගණක උපාංග | 1,210 | - | - |
| 406 රථවාහන බලපත්‍ර හා රක්ෂණ | 75,255 | 38,583 | 350,000 |
| | **981,193** | **2,426,771** | **5,697,000** |

| සටහන -19 | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **ගිවිසුම්ගත ගත සේවා (කේත අංක : 05)** | | | |
| 501 ප්‍රවාහන | 1,622,544 | 1,131,448 | 1,475,000 |
| 502 දුරකථන ගාස්තු | 1,035,512 | 930,682 | 1,100,000 |
| 503 තැපැල් ගාස්තු | 228,730 | 200,035 | 300,000 |
| 504 විදුලිය | 2,840,133 | 3,108,332 | 4,376,000 |
| 505 ජලය | 638,027 | 1,075,922 | 1,046,000 |
| 511 කුලී ගාස්තු හා බදු | 22,649 | 44,734 | 45,000 |
| 508 විගණන ගාස්තු | 294,925 | 575,000 | 200,000 |
| 510 දැන්වීම් ප්‍රචාරණය | 922,963 | 881,118 | 1,500,000 |
| 512 ආරක්ෂක සේවා | 4,768,250 | 5,204,470 | 5,160,000 |
| 513 සනීපාරක්ෂක සේවා | 4,395,188 | 5,498,513 | 4,836,000 |
| 514 ඇපුල්ලුම් සේවා | 295,010 | 297,838 | 400,000 |
| 515 ගෙවතු පවිත්‍ර කිරීම් | 39,477 | 20,875 | 200,000 |
| 516 රක්ෂණය | 695,791 | 545,232 | 665,000 |
| 517 පරිවර්වර්ථන ගාස්තු | 44,031 | - | 100,000 |
| 520 සේවක පුහුණුව (දේශීය/විදේශීය) | 65,000 | 100,000 | 300,000 |
| 521 සාමාජික ගාස්තු | 556,968 | 6,500 | 525,000 |
| 523 අනෙකුත් වියදම් (විවිධ) | 228,235 | 154,635 | 500,000 |
| 524 මුද්‍රණ ගාස්තු මුද්‍රණ අංශය | 251,587 | 90,255 | 450,000 |
| 525 මුද්‍රණ ගාස්තු - ශ්‍රව්‍ය දෘෂ්‍ය | 24,000 | 26,100 | - |
| 526 මුද්දර ගාස්තු | - | | - |
| 530 ශාලා ගාස්තු | - | 26,000 | 60,000 |
| 531 නවාතැන් ගාස්තු | 139100 | 37,500 | 100,000 |
| **එකතුව** | **19,108,120** | **19,955,190** | **23,338,000** |

| සටහන -20 | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **වෙනත් වියදම් (කේත අංක :06)** | | | |
| 601 නීති ගාස්තු | 63,000 | 10,500 | 200,000 |
| 605 වන්දි | - | - | - |
| 607 සංග්‍රහ වියදම් -කාර්යාල සේවක /අමුත්තන් සඳහා | 444,562 | 596,863 | 900,000 |
| 607 සංග්‍රහ වියදම් -ශ්‍රවණාගාරය විවෘත කිරීමේ උත්සවය | 34,169 | 51,188 | 30,000 |
| 703 බැංකු ගාස්තු | - | 25,827 | 60,000 |
| 705 කාර්ය මණ්ඩලය සඳහා වු ණය මත පොලී | 914,961 | 996,131 | 400,000 |
| 707 ජාතිය ගොඩනැගීමේ බදු | 182,373 | 461,552 | - |
| 709 ණය ගැතියන් සඳහා බොල් ණය වෙන්කිරීම් | 279,138 | - | 700,000 |
| 710 ආයතනික අරමුදලට දායකත්වය | - | - | - |
| 713 විනිමය හුවමාරු පාඩු | - | 4,841 | - |
| | **1,918,204** | **2,146,903** | **2,290,000** |

| සටහන : 5 - A | 2017 රු | 2018 රු |
|---|---|---|
| **ලැබිය යුතු පාඨමාලා ගාස්තු** | | |
| 3501 සමුපකාර ඩිප්ලෝමා පාඨමාලා | 563,645 | 212,105 |
| 3502 සමුපකාර සහතිකපත්‍ර පාඨමාලා | 31,056 | - |
| 3503 වැඩමුළු | 178,450 | 482,510 |
| 3505 පරිගණක කෙටිකාලීන පාඨමාලා | 32,475 | - |
| 3506 කෙටිකාලීන වෙනත් පාඨමාලා | 1,145,898 | 965,152 |
| 3507 වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | 61,030 | 166,450 |
| 3508 NICD පරිගණක ඩිප්ලෝමාව | 49,000 | 114,500 |
| 3509 ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව | - | 173,600 |
| 3511 ඉංග්‍රිසි පාඨමාලා | 26,320 | 42,125 |
| 3522 පුස්තකාල හා විභාග ගාස්තු | 11,850 | - |
| | **2,099,723** | **2,156,442** |

| සටහන :12-A | 2017 රු | 2018 රු |
|---|---|---|
| **කලින් ලැබූ පාඨමාලා ගාස්තු** | | |
| 4023 සමුපකාර ඩිප්ලෝමා පාඨමාලා | 1,381,280 | 1,534,815 |
| 4024 වැඩමුළු | - | 84,486 |
| 4025 වෙනත් පාඨමාලා | 106,435 | 43,375 |
| | **1,487,715** | **1,662,676** |

| සටහන: 14-A | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **පාඨමාලා ගාස්තු ආදායම්** | | | |
| 1001 සමුපකාර උසස් ඩිප්ලෝමා පාඨමාලා | 4,069,254 | 3,864,504 | 5,243,175 |
| 1001- වෘත්තීමය ඩිප්ලෝමා පාඨමාලා | 485,000 | 705,600 | 781,067 |
| 1002 NICD පරිගණක ඩිප්ලෝමාව | 493,825 | 498,250 | 814,000 |
| 1003 පරිගණක සහතික පත්‍ර පාඨමාලාව | 924,750 | 551,000 | 2,727,500 |
| 1004 ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | 438,060 | 419,640 | 648,000 |
| 1005 විශේෂ පාඨමාලා | | | - |
| 1005 -01 පාඨමාලා ගාස්තු ගණකාධිකරණ ශිල්පීය ආයතනය | 859,725 | 606,075 | 952,500 |
| 1005 -02 පාඨමාලා ගාස්තු වරලත් ගණකාධිකරණ | 1,710,345 | 2,875,835 | 2,040,000 |
| 1007 සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව | 2,121,228 | 1,075,716 | 928,778 |
| 1008 කෙටිකාලීන වැඩමුළු | 3,356,410 | 2,564,800 | 4,615,000 |
| 1009 පරිගණක කෙටිකාලීන පාඨමාලා | 598,170 | 1,618,368 | 112,500 |
| 1010 කෙටිකාලීන පාඨමාලා | 1,617,146 | 2,376,488 | - |
| | **16,673,912** | **17,156,276** | **18,862,520** |

| සටහන: 14-B | 2017 රු | 2018 රු | අයවැය රු |
|---|---|---|---|
| **වෙනත් ආදායම්** | | | |
| 1016 ගෙවතු ආදායම | 88,800 | 102,637 | - |
| 1034 නේවාසික කළමනාකාර ගාස්තු | 45,300 | 59,350 | - |
| 1038 ඡායා පිටපත් ගාස්තු | - | 5,894 | - |
| 1040 උපකරණ කුලියට දීම | 212,801 | 735,685 | 650,000 |
| 1044 වතුර බෝතල් | 140,285 | 320,735 | 300,000 |
| 1045 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 101,304 | 119,130 | - |
| 1046 ඡායා රූප ආදායම | - | - | - |
| 1047 දඩ මුදල් | 1,109,024 | 128,774 | - |
| 1048 පොත් බැඳීම | 100 | 900 | - |
| 1051 වෙනත් ආදායම් | 10,379 | 41,300 | 600,000 |
| 1056 බස් රථයේ ආදායම් | 84,065 | 67,180 | 400,000 |
| 1061 අතිරේක ආදායම් | 8,990 | 15,568 | - |
| 1062 නොඉල්ලූ ගෙවිය යුතු මුදල් | 53,750 | - | - |
| 1080 AAT ප්‍රකාශන කොමිස් මුදල් | 11,320 | 10,456 | - |
| 1071 පුවත්පත් අලෙවිය | - | 500 | - |
| 1066 අලාභහානි වූ භාණ්ඩ සඳහා අයකිරීම් | - | 14,500 | - |
| 1067 හඳුනා නොගත් තැන්පත් | | 58,500 | - |
| 1082 රැඳවුම් මුදල් | 56,297 | - | - |
| | **1,922,414** | **1,681,109** | **1,950,000** |

## 1. විගණකාධිපති වාර්තාව -2018

59

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CLP/KD/I/NICD/01/18/ඇ.ශි./22 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019 ජුනි 18 දින

සභාපති,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,

**ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

58

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ආයතනය සතු මෝටර් රථ ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.10,447,500 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව සමූපකාර අරමුදලට ගෙවිය යුතු රු.24,000,000 ක ණය ශේෂය ජංගම නොවන හා ජංගම වගකීම් වශයෙන් වෙන් වෙන්ව හඳුනාගෙන ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේදී ගොඩනැගිලිවල සමුච්චිත ක්ෂය වටිනාකම රු.1,151,977 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදනය රු.30,530,000 ක් වුවත්, ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු භාණ්ඩාගාර ප්‍රදාන වලින් ඉතිරිව තිබූ රු.543,744 ක් හා වෙනත් ගැලපිලි කර වර්ෂයේ ආදායම ලෙස රු.31,134,685 ක් කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රදාන රු.604,685 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.1,269,014 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) එකතුව රු.147,777,656 ක් වූ යන්ත්‍ර උපකරණ, ලී බඩු උපකරණ සම්බන්ධයෙන් වත්කම් ලේඛන හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

57

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ

3

56

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ හැර** යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

54

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීති, රීති / විධානයට යොමුව | | විස්තරය |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය | අර්ථසාධක අරමුදලට දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව පදනම් කරගත යුතු වුවද, එසේ නොමැතිව 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූලික වැටුප පමණක් සැලකිල්ලට ගෙන සේවක අර්ථසාධක අරමුදල් ගණනය කිරීම හේතුවෙන් සේවකයාගේ දායක මුදල වන රු.1,673,929 ක් සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ අධ්‍යයන හා පුහුණු ගිණුමෙන් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3.3 වගන්තිය | ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුක් සඳහා අනියම් පදනම මත බඳවා ගන්නා පුරප්පාඩු තනතුරු මාස තුනක් ඇතුළත පිරවිය යුතු වුවත් මෙම ආයතනයෙහි අනියම් පදනම මත සේවකයන් තිදෙනෙකු වසර 3 ක කාලයක් සේවයේ යොදවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මුදල් රෙගුලාසි 103 සිට 105 දක්වා | ආයතන පරිශ්‍රයේ සඳුන්ගස හා මුල අවස්ථා 2 කදී සොරුන් කපාගෙන ගොස් තිබුණි. සඳුන් ගස සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක්ද සඳුන් ගසේ මුල සොරාගෙන මාස 7 ක් ගතවී ඇතත්, ප්‍රාරම්භක හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ආයතනයේ ආරක්ෂාව සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.5,204,470 ක් වැයකර තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 104 (4) | 2014 ජුනි 01 දින අනතුරට ලක් වූ ආයතනය සතු මෝටර් රථයක් වර්ෂ 4 ක පමණ කාලයක් භාවිතයට නොගෙන කාර්යාල භූමියේ ස්වභාවික ආපදාවලට ලක් වෙමින් නිෂ්ක්‍රියව පැවතුණු අතර, පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

6

53

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2013 හා 2014 වර්ෂවලදී රු. මිලියන 5 ක මුදලක්ද සමාලෝචිත වර්ෂයේදී මිලියන 10 ක මුදලක්ද ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණය හැර** ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන කටයුතු කර ඇති බව.

| **බලතල , කර්තව්‍ය, කාර්යයයන්** | **නිරීක්ෂණ** |
|---|---|
| 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණු වන සමූපකාර සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය, නවීන තාක්ෂණික ක්‍රම මඟින් පුහුණුව සැපයීම, සමූපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, නිපුනතා අවශ්‍ය වන සමූපකාර කළමනාකරණය කිරීම, වෘත්තිය උපදෙස් ලබා දීම හා ආදර්ශ සමූපකාර ගම්මාන හා වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවීම සිදුකළ යුතුය. | පනතේ සඳහන් කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**03. අනෙකුත් විගණන නිරීක්ෂණ**

(අ) බාහිර පාර්ශවයන් වෙත කුළියට දී ආදායම් ඉපයීමේ අරමුණින් රු.මිලියන 257 ක් වැය කර නරඹන්නන් 1127 ක ප්‍රමාණයක් සඳහා ඉඩ පහසුකම් ඇතිව හා ලොබි දෙකකින් සමන්විත ශ්‍රවනාගාරය 2018 වර්ෂයේදී ප්‍රයෝජනයට ගෙන තිබුණේ අවස්ථා 29 කදී පමණක් වන අතර, මෙම ශ්‍රවනාගාරය තුළ ආනයනික පුටු 160 කින්

S2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සමන්විත ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු පැවැත්වීමට හැකි සම්මන්ත්‍රණ ශාලා දෙක 2014 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) 2014 වර්ෂයේදී රු.16,000,000 ක වියදමක් දරා සුබෝපභෝගී ආකාරයට වැඩි දියුණු කර ආයතනය සතු සංචාරක නිවාසය සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කර තිබුණේ අවස්ථා 29 කදී පමණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු.5,939,694 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක පැවති ශේෂ එකතුව රු.1,730,268 ක් හා වසර 5 ට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂවල වටිනාකම රු.879,859 ක් විය.

(ඈ) 2005 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැට් බදු ශේෂය රු.33,933,319 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කරගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.98,001,141 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක නිරවුල් නොකල ශේෂ එකතුව රු.62,480,490 ක් හා වසර 5 ක කාලයක් ඉක්මවා නිරවුල් නොකල ශේෂයන්හි එකතුව රු.34,365,853 ක් වී තිබුණි.

(ඊ) ආයතනයේ වාණිජ වටිනාකමින් යුක්ත ඉඩම් කොටසක පිහිටි පැරණි කාර්යාල ගොඩනැගිල්ල 2008 වර්ෂයේ සිට නිෂ්කාර්යව පවතින අතර මෙය අලුත්වැඩියා හෝ නව ඉදිකිරීමක් සිදුකර ප්‍රයෝජනයට ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. තවද, මහවැලි ගොඩනැගිලි පරිශ්‍රය ලෙස හඳුන්වා ඇති ආයතනය සතු ගොඩනැගිල්ලක් 2001 වර්ෂයේ සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි.

(උ) කළමනාකරණ මණ්ඩල තීරණ අනුව කථිකාචාර්යවරයෙක් මාසයකට වැඩ කළ යුතු අවම පැය ගණන පැය 60 බැගින් කථිකාචාර්යවරු 4 දෙනෙකු විසින් 2018 වර්ෂයේදී පවත්විය යුතු මුළු දේශන පැය ගණන 2880 ක් විය යුතු වුවද, වර්ෂය තුළ පවත්වා තිබූ දේශන පැය ගණන 1904 ක් විය. ඒ අනුව වර්ෂය තුළ පැය 976 ක් දේශන අඩුවෙන් පවත්වා තිබුණි.

(ඍ) ආයතනය සතු බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම් මහල තුළ වර්ග අඩි 2979 ක් පමණ වූ පරිශ්‍රය තුළ පවත්වා ගෙන ගිය කෝප්සිටි ආදර්ශ වෙළඳසැල 2017 අගෝස්තු 25 දින ආයතනයට නැවත භාරදී තිබූ අතර, එම පරිශ්‍රය ඵලදායී කාර්යයකට යොදාගෙන නොතිබීමෙන් තක්සේරුව අනුව සමාලෝචිත වර්ෂයේදී පමණක් රු.720,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(එ) 2014 වර්ෂයේදී ආයතනයේ පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණ රු.6,000,000 කින් රු.2,623,316 ක මුදලක්ද, ශ්‍රවනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී ලැබුණු රු.68,445,000 ක මුදලින් වැය නොකල රු.29,755,000 ක මුදලක්ද සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු මුදලින් රු.17,773,317 ක මුදලක්ද බැංකු ජංගම ගිණුම තුළ රඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති